# (ආ) විදේශීය වෙළෙඳාම

**පොදු ලක්ෂණ**

රේගු වාර්තාවන්හි දක්වෙන අයුරු ලංකාවේ විදේශීය වෙළෙඳාම පිළිබඳ සම්පූර්ණ විස්තර 11 ආ - 1 සංඛ්‍යා සටහනෙහි දක්වෙයි.

සංඛ්‍යා සටහන II ආ - 1

**විදේශීය වෙළෙඳාම 1959—1964**

| වර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | ආනයන වල තුබූ අපනයන අනුපාතයෙහි සියයට ගණන |
|---|---|---|---|---|
| | අපනයන * (නැ. වි. ස.) | ආනයන (මි. ර. ගැ.) | වෙළෙඳ ශෙෂය | |
| 1959 | 1754 | 2005 | —251 | 87 |
| 1960 | 1832 | 1960 | —128 | 93 |
| 1961 | 1733 | 1703 | + 30 | 102 |
| 1962 | 1808 | 1660 | +148 | 109 |
| 1963 | 1731 | 1490 † | +241 | 116 |
| 1964 | 1876 | 1975 | — 99 | 95 |

සංඛ්‍යා: රේගු වාර්තාවලිනි.

* ප්‍රති අපනයන ඇතුළුව

† මෙය 1963 සඳහා ප්‍රතිශෝධිත ආනයන වටිනාකමය.

1964 දී රුපියල් කෝටි 187.6 ක්වූ මුළු අපනයන විටිනාකම පසුගිය වසරට වඩා රුපියල් කෝටි 14·5 කින් හෙවත් සියයට 8 කින් වැඩිවිය. රුපියල් කෝටි 197·5 ක ඉතා වැඩි බවක් දක්වූ මුළු ආනයන වටිනාකම අභිබවනය කොට ඇත්තේ මීට පෙර එක් වරකදී පමණි.(1) ඉතා බලවත් ආනයන පාලන විධිවිධානයන්ද නොතකා මුළු ආනයන වටිනාකම පසුගිය වසරට වඩා සීඝ්‍රයෙන්, එනම් රුපියල් කෝටි 48·5 කින් හෙවත් සියයට 33 කින් වැඩිවිය. රේගු වාර්තාවන්හි සඳහන් අන්දමට වෙළෙඳ ශෙෂය රුපියල් කෝටි 9·9 ක අවාසියක් දක්විය. 1963 දී හා 1962 දී පිළිවෙළින් රුපියල් කෝටි 24·1 හා රුපියල් කෝටි 14·8 ක් වූ අතිරික්තයන් අනුව මෙම වර්ෂයෙහි ඉතා විශාල වෙනසක් පිළිබිඹු වෙයි. පසුගිය වර්ෂයේ 116 ක් වූ අපනයන ආනයන අනුපාතය මෙම වර්ෂයේදී 95 ක් විය.

---

(1) මෙම විශාල හිඟය පිළිබඳව සලකා බැලිය යුත්තේ එහි ඇති කිසියම් විශේෂතාවයක් පිළිබඳව කල්පනා කාරිවය. 1963 වාර්ෂික වාර්තාවෙහි 39 වැනි පිටුවෙහි වූ අධොලිපියෙහි සඳහන් වන පරිදි ආනයන භාණ්ඩ ඉවත් කිරීමත් ඒ බව රේගු වාර්තාවල ලේඛන ගතවීමත් අතර කාල පරතරයක් ඇතිවිය හැකිවීම නිසා ඇත්ත වශයෙන් ආනයනය කළ භාණ්ඩයන්ගේ වටිනාකමෙහිත් එම කාල සීමාව තුළ රේගුවෙන් ඉවත් කළ බවට වාර්තාවල සඳහන් වන භාණ්ඩයන්ගේ වටිනාකමෙහිත් වෙනසක් ඇතිවිය හැක. මෙම කරුණු බොහෝ දුරට බලපාන්නේ රජයේ ආනයනයන් කෙරෙහිය. මෙය වඩාත් පැහැදිලිව විද්‍යාමාන වන්නේ මුළු ආනයන වටිනාකමෙන් විශාල කොටසක්වූ සහල්, තිරිඟු පිටි හා සීනි ආනයනයන් පිළිබඳවය. 1963 හා 1964 වර්ෂයන්හි ආනයනය කරන ලදැයි රේගු වාර්තාවන්හි සඳහන් වන සහල්, තිරිඟු පිටි හා සීනිවල වටිනාකම්ද ආහාර කොමසාරිස්වරයා විසින් එම කාලය තුළ තමන් වෙත ලැබුණු බව සඳහන් කරන මුළු ආනයනයන්ගේ වටිනාකම් ද පහත සඳහන් වෙයි.

රුපියල් දශලක්ෂ

| වර්ෂය | ආහාර කොමසාරිස්වරයා වෙත ලැබුනු ආනයන | රේගු වාර්තාවන්හි සඳහන් ආනයන | වෙනස |
|---|---|---|---|
| 1963 | 460 | 322 | —138 |
| 1964 | 557 | 648 | + 91 |

කොළඹ වරායෙහි අසහනකාරී තත්වය පිළිබඳව පසුගිය වාර්ෂික වාර්තාවෙහි කරුණු සඳහන් විය. එම තත්වය නිසා වර්ෂයේ අවසාන දෙමසෙහි අපනයනයන්ගේ හා ආනයනයන්ගේ ගලායාම කෙරෙහි අහිතකර තත්වයක් උද්ගතව පැවැති බවද එහි සඳහන් කරන ලදී. 1964 දී මෙම තත්වය ඉතා හිතකර අන්දමේ දියුණුවක් ලැබූ බව සඳහන් කළ යුතු වෙයි. (1) පසුගිය වර්ෂය සමග සසඳන කල්හි මෙම වර්ෂය තුළදී නැව්ගත කරන ලද අපනයන ටොන් 1,40,873 කින් හෙවත් සියයට 30 කින් වැඩිවිය. ගොඩබාන ලද ආනයනයන් ටොන් 1,73,808 කින් හෙවත් සියයට 9 කින් වැඩිවිය. මෙම දියුණුව හේතුකොටගෙන සමහර නැව් සමාගම් සංවිධාන කොළඹදී ගොඩබෑම සඳහා නැව් ගත කරන ලද භාණ්ඩයන් සඳහා වූ නැව් කුලී අඩිමිල අඩු කළහ. (2)

---

මෙ අනුව රේගු වාර්තාවන්හි සඳහන් ආනයන 1963 දී රුපියල් කෝටි 13·8 ක අඩු තක්සේරුවක් දක්වා ඇති අතර, 1964 දී රුපියල් කෝටි 5·7 ක අධි තක්සේරුවක් දක්වයි·

1963 හා 1964 සඳහා රේගු වාර්තාවන්හි සඳහන් මුළු ආනයනයන්ගේ වටිනාකම් ආහාර කොමසාරිස්වරයා වෙත ලැබුනු ආනයනයන්ගේ වටිනාකම්වලට සමවන අයුරින් ගලපන ලද්දේ නම් පහත සඳහන් තත්වය දක්වෙනු ඇත·

| | 1963 | 1964 |
|---|---|---|
| | | රුපියල් දශලක්ෂ |
| අපනයන | 1,731 | 1,876 |
| ආනයන (ගලපන ලද වටිනාකම්) | 1,628 | 1,884 |
| වෙළෙඳ ශේෂය | + 103 | — 8 |

මේ අනුව 1963 දී වූ රුපියල් කෝටි 24·1 අතිරික්තය රුපියල් කෝටි 10·3 දක්වා පහත බසින අතර 1964 දී වූ රුපියල් කෝටි 9·9 හිඟය රුපියල් කෝටි 1·2 ක හිඟයක් බවට පත්වෙයි·

(1) කොළඹ වරායේ බඩු ගොඩබෑම හා පැටවීම පිළිබඳ පහත සඳහන් සංඛ්‍යා තොරතුරු වලින් එම දියුණුව දක්නට ලැබෙයි·

**කොළඹ වරාය තුළ ගොඩබාන ලද හා පටවන ලද ආනයන අපනයන භාණ්ඩ ප්‍රමාණය (ටොන්වලින්)**

| | 1963 | 1964 | වෙනස: නිරපේක්ෂ | වෙනස: % |
|---|---|---|---|---|
| 1 වැනි කාර්තුව | 653,384 | 650,674 | — 2,710 | ... |
| 2 වැනි කාර්තුව | 588,572 | 690,937 | +102,365 | + 17 |
| 3 වැනි කාර්තුව | 608,535 | 719,905 | +111,370 | + 18 |
| 4 වැනි කාර්තුව | 562,475 | 666,126 | +103,651 | + 18 |
| වර්ෂය | 24,12,966 | 27,27,642 | +314,676 | + 13 |

සංඛ්‍යා—වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය.

(2) පහත දක්වෙනුයේ එම සංවිධානයන් විසින් කරන ලද අඩු කිරීම්ය·

**(1) එක්සත් රාජධානිය හා මහාද්වීපය / කොළඹ නැව් සමාගම් සංවිධානය**

1964 ජූලි 6 — මූලික නැව් කුලී වලින් සියයට 50 ක් වූ අඩිමිල සියයට 40 දක්වා අඩු කරන ලදී·

1964 ඔක්තෝබර් 15 — අඩිමිල සියයට 30 දක්වා අඩු කරන ලදී·

1965 ජනවාරි 1 — අඩිමිල සියයට 20 දක්වා අඩු කරන ලදී·

**(11) ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය / කොළඹ නැව් සමාගම් සංවිධානය**

**(අ) ඕස්ට්‍රේලියාව**

1964 සැප්තැම්බර් 1 — කොළඹ වරායෙන් ගොඩබාන ආනයනයන් සඳහා වූ අඩිමිල සියයට 35 සිට 25 දක්වාද අනෙකුත් වරායන් සඳහා වූ අඩිමිල සියයට 10 දක්වාද අඩු කරන ලදී·

**(ආ) නවසීලන්තය**

1964 සැප්තැම්බර් 3 — කොළඹ වරායෙන් ගොඩබාන ආනයනයන් සඳහා වූ අඩිමිල සියයට 35 සිට සියයට 25 දක්වාද, ත්‍රිකුණාමල වරාය සඳහා වූ අඩිමිල සියයට 10 දක්වාද අඩු කරන ලදී·

11 ආ-2 සංඛ්‍යා සටහන අපනයන සැකැසුම පෙන්නුම් කරයි.

සංඛ්‍යා සටහන 11 (ආ) 2

**අපනයන සැකැසුම**

| භාණ්ඩය | වටිනාකම රුපියල් දශලක්ෂ | | | | | මුළු අපනයන වලින් සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
| තේ | 1096 | 1115 | 1149 | 1140 | 1142 | 60 | 64 | 64 | 66 | 61 |
| රබර් | 378 | 260 | 290 | 257 | 290 | 21 | 15 | 16 | 15 | 15 |
| ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන | 184 | 202 | 227 | 198 | 273 | 10 | 12 | 13 | 11 | 15 |
| අනෙකුත් දේශීය අපනයන | 117 | 104 | 100 | 110 | 137 | 6 | 6 | 5 | 6 | 7 |
| මුළු දේශීය අපනයන | 1775 | 1681 | 1766 | 1705 | 1842 | 97 | 97 | 98 | 98 | 98 |
| ප්‍රති අපනයන | 57 | 52 | 42 | 26 | 34 | 3 | 3 | 2 | 2 | 2 |
| එකතුව | 1832 | 1733 | 1808 | 1731 | 1876 | 100 | 100 | 100 | 100 | 100 |

සංඛ්‍යා—රේගු වාර්තාවලිනි

ආනයන ආදායම්වල වැඩිවීමට හේතුවූයේ මුළු අපනයන පරිමාවෙහි වැඩි-වීමෙකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අපනයන පරිමා දර්ශකය 119 දක්වා, එනම්, සියයට 7 කින් වැඩිවීමෙක් දක්විය. අපනයනයන්ගේ සාමාන්‍ය මිල වසර තුළ නොවෙනස්ව පැවතිනි. පසුගිය සතර අවුරුද්ද තුල ඒ ඒ භාණ්ඩයන්ගේ මිලෙහි උච්චාවචනයන් පැවතියද සියළු අපනයනයන්ගේ සාමාන්‍ය මිලෙහි එතරම් වෙනස්වීමක් දක්නට නොලැබුනි. මෙම කාලසීමාව තුල එම මිල නොවෙනස්ව පැවතුනද එය පසුගිය දශකය තුල පැවති ඉතාමත් අඩු මිල මට්ටම විය. මෙය 1957 – 1960 සාමාන්‍ය මිල මට්ටමට වඩා සියයට 9 ක පහත වැටීමෙක් දක්වීය.

මුළු අපනයන ආදායම වැඩිවූයේ සියළු ප්‍රධාන අපනයනයන්ගේ ආදායම වැඩිවීමෙනි. විදේශ විණිමය උපයන භාණ්ඩ අතර ප්‍රධාන ස්ථානය ගන්නා තේ වලින් ලැබෙන අපනයන ආදායමෙහි ඉතා සුළු වැඩිවීමෙක් දක්විය. එනම්, රුපියල් කෝටි 0·2 ක් හෝ සියයට 0·2 ක් විය. මුළු අපනයන ආදායමෙහි තේවලට අයත් කොටස පසුගිය වසරෙහි වූ සියයට 66 සිට සියයට 61 දක්වා පහත බැස්සේය. තේ අපනයන පරිමාව නොවෙනස්ව පැවති අතර ඒවායේ රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල රුපියල් 2.51 ක් වූයේ, රාත්තලක් ගත 1 කින් වැඩිවිය.

රබර් වලින් ලැබෙන අපනයන ආදායම රුපියල් කෝටි 3·3 ක හෙවත් සියයට 13 ක වැඩිවීමෙක් දක්විය. මුළු අපනයන ආදායමෙහි රබර්වලට අයත් කොටස නොවෙනස්ව පැවතිනි. රබර් අපනයන පරිමාව තියුණු ලෙස සියයට 21 කින් වැඩිවිය. රුපියල් 1·15 ක් වූ රබර් රාත්තලක සාමාන්‍ය නැ. වි. ස. මිල පසුගිය වසරට වඩා සත 8 ක පහත වැටීමෙක් දක්විය.

පොල් නිෂ්පාදිත තුනෙහි ආදායම ඉතා වැඩි පමණකින් ඉහළ ගියේ, පසුගිය වසරට වඩා රුපියල් කෝටි 7·5 ක හෙවත් සියයට 38 ක වැඩිවීමෙක් දක්විය. මුළු අපනයන ආදායමෙහි මෙම නිෂ්පාදිත සතු කොටස පසුගිය වසරේදී වූ සියයට 11 සිට 15 දක්වා වැඩිවූයේ මුළු අපනයන පරිමාවෙහි සියයට 3·4 ක තියුණු ප්‍රසාරණ-

යක් ඇතිවීමෙනි. පොල්තෙල් හා කොප්පරා සඳහා වූ සාමාන්‍ය නැ. වි. ස. මිල පිළිවෙලින් සියයට 7 ක හා සියයට 4 ක වැඩිවීමෙක් දක්විය. කපාපු පොල් සඳහා වූ සාමාන්‍ය නැ. වි. ස. මිල පසුගිය වසරට වඩා සියයට 4 කින් පහත වැටුනි.

අනෙකුත් දේශීය අපනයනයන්ගේ ආදායම රුපියල් කෝටි 2·7 කින් හෙවත් සියයට 25 කින් වැඩිවිය. පොල් කෙඳි හා කුරුඳු පිළිවෙලින් රුපියල් කෝටි 5·7 ක හා රුපියල් කෝටි 2·5 ක හෙවත් සියයට 36 ක හා සියයට 28 ක වැඩිවීමෙක් දක්වීය. ප්‍රති අපනයනයන්ගේ වටිනාකම 1959 දී වූ රුපියල් කෝටි 6.2 සිට ක්‍රමෙන් පහත වැටුනි. මෙම අපනයනයන්ගෙන් 1964 දී ලද ආදායම පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3·4 කින් හෙවත් සියයට 31 කින් වැඩිවිය. ප්‍රති අපනයනය කරන ලද නාවික තෙල් වර්ග රුපියල් කෝටි 0.6 ක හෙවත් සියයට 35 ක වැඩිවීමෙක් දක්විය.

ඉහතින්ද සඳහන් කල පරිදි රේගු වාර්තාවන් අනුව මුළු ආනයනයන්ගේ වටිනාකම රුපියල් කෝටි 197·5 දක්වා රුපියල් කෝටි 48·5 කින් තියුණු ලෙස වැඩිවීම කල්පනාකාරීව සලකා බැලිය යුතුවෙයි. මෙම වාර්තාවන් අනුවම සැකැසුනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ආනයන පරිමා දර්ශකය පසුගිය වසරට වඩා 26 ක ඉහළ යාමක් දක්විය. ප්‍රධාන ආනයන භාණ්ඩ ගණ දර්ශකවලින් පිළිබිඹු වූයේ මෙම වැඩිවීම, පාරිභෝජන භාණ්ඩ හා අයෝජන භාණ්ඩවලට පමණක් සීමාව තිබූ බවයි. පාරිභෝජන භාණ්ඩ ගණ දර්ශකය 101 දක්වා 36 කින්ද, ආයෝජන භාණ්ඩ ගණ දර්ශකය 104 දක්වා 11 කින්ද වැඩිවිය. අන්තර් භාණ්ඩ ගණ දර්ශකය 1 කින් පහත බැස්සේ, මෙම වසරේදී 123 ක් විය. පාරිභෝජන භාණ්ඩ ගණයෙහි සියලු උපගණයන් කෙරෙහි මෙම ප්‍රසාරණය බලපෑවේය. 'ආහාරපාන' 'රෙදිපිළි' සහ 'අනෙකුත් පාරිභෝජන භාණ්ඩ' උප ගණයන් සඳහා වූ දර්ශක පිළිවෙලින් 125, 92 හා 39 වූයේ පිළිවෙලින් 40, 50 හා 14 බැගින් වැඩිවීමෙක් දක්විය.

1963 දී ආනයනයන්ගේ සාමාන්‍ය මිල සියයට 11 ක වැඩිවීමෙක් දක්වීය. එතරම් වේගවත් බවකින් සිදු නොවුවද මෙම වර්ෂය තුලදී ද එම වැඩිවීම තවදුරටත් පැවතුනි. ආනයනයන්ගේ සාමාන්‍ය මිල දක්වෙන මහ බැංකු දර්ශකය 107 ක් වූයේ පසුගිය වසරට වඩා 2 කින් වැඩිවීමෙක් දක්වීය. ප්‍රධාන ආනයන ගණ දර්ශකයන් අතර 116 ක්වූ මුළු පාරිභෝජන භාණ්ඩ ගණ දර්ශකය 4 කින් ද, පිළිවෙලින් 82 හා 96 බැගින් වූ අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ගණ දර්ශක 4 හා 2 බැගින්ද පහත වැටුනි. පාරිභෝජන භාණ්ඩ ගණයෙහි 'ආහාර පාන' මිල දර්ශකය 115 ක් වූයේ 8 කින් වැඩි විය. 'අනෙකුත් පාරිභෝජන භාණ්ඩ' මිල දර්ශකය 129 ක්ව පැවතියේ 3 කින් වැඩිවිය. "රෙදිපිළි" මිල දර්ශකය 101 ක් වූයේ පසුගිය වසර ටවඩා 3 කින් පහත වැටුනි.

1963 දී ලංකාවේ වෙළෙඳ ශේෂයෙහි සියයට 9 ක පහත වැටීමෙක් විය. මෙම වර්ෂයේදී එය තවදුරටත් පහත වැටුනි. මහ බැංකු වෙළෙඳ ශේෂ දර්ශකය පෙර වසරට වඩා 3 කින් 86 දක්වා පහත වැටුනේ. සියයට 3 ක පහත වැටීමෙක් දක්විය.

**අපනයන.**

**තේ.**

II අා - 3 සංඛ්‍යා සටහන තේ නිෂ්පාදනය, අපනයන හා මිල පිළිබඳ විස්තර දක්වයි.

සංඛ්‍යා සටහන II අා - 3

**තේ නිෂ්පාදනය, අපනයන සහ මිල.**

| වර්ෂය | නිෂ්පාදනය | අපනයන | | කොළඹ වෙන්දේසියේ රාත්තලක මිල සාමාන්‍ය ය | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රාත්තල් දශ ලක්ශ | ප්‍රමාණය රාත්තල් දශලක්ෂ | රාත්තලක නැ. වි. ස මිල රු. සත | උස්බිම වගාව රු. සත | මැදි බිම වගාව රු. සත | පහත් බිම වගාව රු. සත | සියලු තේ වර්ග රු. සත |
| 1955 | 380 | 362 | 3·30 | 2·34 | 2·04 | 2·40 | 2·24 |
| 1956 | 376 | 348 | 3·00 | 2·50 | 1·96 | 1·88 | 2·16 |
| 1957 | 398 | 368 | 2·78 | 2·05 | 1·61 | 1·88 | 1·86 |
| 1958 | 413 | 411 | 2·75 | 2·11 | 1·51 | 1·48 | 1·73 |
| 1959 | 413 | 384 | 2·72 | 2·13 | 1·69 | 1·67 | 1·85 |
| 1960 | 435 | 410 | 2·67 | 2·03 | 1·75 | 1·83 | 1·88 |
| 1961 | 455 | 426 | 2·62 | 1·99 | 1·72 | 1·74 | 1·83 |
| 1962 | 467 | 452 | 2·54 | 2·02 | 1·61 | 1·56 | 1·75 |
| 1963 | 485 | 456 | 2·50 | 1·90 | 1·54 | 1·53 | 1·68 |
| 1964 | 482 | 456 | 2·51 | 1·93 | 1·58 | 1·49 | 1·68 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා
කොළඹ තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය
තේ පාලක තැනගේ පාලන වාර්තා

1964 දී තේ නිෂ්පාදනය රාත්තල් කෝටි 48·2 ක් විය. මෙය පසුගිය වසරේදී වූ රාත්තල් කෝටි 48·5 නිෂ්පාදන වාර්තාවට වඩා රාත්තල් කෝටි 0·3 ක හෙවත් සියයට 1 ක අඩුවීමෙක් දැක්විය. මෙම පහත වැටීම අපනයනයන් කෙරෙහි බල පෑයේ නොවේ. අපනයන පරිමාව 1964 දී රාත්තල් කෝටි 45·6 ක් වූයේ 1963 ප්‍රමාණයෙහිම පැවතියේය.

මෙම වසරේදී කොළඹ තේ වෙන්දේසියේ සියළු තේ වර්ගයන්හි රාත්තලක සාමාන්‍ය මිළ රුපියල් 1·68 ක් වූයේ පසුගිය වසරෙහි මිළ මට්ටමෙහිම පැවතිනි. 1955 දී සිට අනුක්‍රමයෙන් පහත වැටෙමින් පැවති මෙම මිළ 1964 දී තාවකාලිකව හෝ පහත වැටීමකින් තොරව පැවැතියේය. කෙසේ වුව, එක් එක් වර්ගයන්හි තේ මිලෙහි වෙනස්වීම් වල කැපී පෙනෙන විවිධත්වයක් දක්නට ලැබුනි. උස් බිම් වගාවේ තේ රාත්තලක සාමාන්‍ය මිළ රු. 1·93 දක්වා රාත්තලක් සත 3 කින් ද, මැදි බිම් වගාවේ තේ රාත්තලක සාමාන්‍ය මිල රුපියල් 1·58 දක්වා රාත්තලක් සත 4 කින් ද වැඩිවිය. පහත් බිම් වගාවේ තේ රාත්තලක සාමාන්‍ය මිළ රුපියල් 1·49 ක් වූයේ රාත්තලක් සත 4 කින් පහත වැටීමෙක් දැක්විය. වසරේ දෙවන කාර්තුවේදි හැරෙන්නට උස් බිම් වගාවේ තේ රාත්තලක සාමාන්‍ය මිළ අනෙක් සෑම කාර්තුවකම පසුගිය වසරට වඩා වැඩිවීමෙක් දැක්වූයේ අවසන් කාර්තුවේ සත 8 ක වැඩිවීමෙක් දක්විය. මෙම වසරේ පළමු අඩෙහි දී මැදිබිම් වගාවේ තේ මිල පසුගිය වසරෙහි එම කාලසීමාවේදී වූ මිලට වඩා පහත වැටීමෙක් දැක්විය. මැදිබිම් වගාවේ තේ වල පසුගිය වසරේ එම අඩෙහිදී වූ මිලට වඩා සීඝ්‍ර ඉහලයාමක්

මෙම වසරේ දෙවන භාගයේ දී ද දක්නට ලැබුනි. මෙම වසරේ අවසන් කාර්තුවේදී මැදි බිම් වගාවේ තේ මිල පසුගිය වසරේ එම කාර්තුවට වඩා රාත්තලකට සත 22 ක වැඩිවීමෙක් දැක්වීය.

මෙම වසරේදී පහත් බිම් වගාවේ තේ මිල වෙනස් වූ අයුරු හා ප්‍රධාන වෙළෙඳ පොළවල මෙම වර්ගයේ තේ සඳහා වූ විශෙෂ සිදුවීම් ගැන වෙසෙසින්ම සඳහන් කළ යුතුව ඇත. පහත් බිම් වගාවේ තේ සඳහා ඒ ඒ කාර්තුවල සාමාන්‍ය මිල පසුගිය වර්ෂයේ එම කාර්තු සමග සැසඳීමෙක් පහත දැක්වෙයි.

**1963 - 1964 වර්ෂයන්හිදී පහත් බිම් වගාවේ තේ සඳහා කොළඹ තේ වෙන්දේසියේ සාමාන්‍ය මිල**

| | රාත්තලක මිළ රුපියල් | |
|---|---|---|
| | 1963 | 1964 |
| 1 වන කාර්තුව .. .. .. | 1·60 | 1·61 |
| 2 වන කාර්තුව .. .. .. | 1·60 | 1·58 |
| 3 වන කාර්තුව .. .. .. | 1·44 | 1·38 |
| 4 වන කාර්තුව .. .. .. | 1·50 | 1·40 |

මේ වසරේ මුල් භාගයේ දී සිදුවූ වෙනස්වීම් ඉතා සුළු ඒවා විය. එනමුදු 3 වන හා 4 වන කාර්තුවලදී මෙම වගීයේ තේ වල මිල පසුගිය වසරේ එම කාලසීමාවන්ට වඩා පිළිවෙලින් රාත්තලකට සත 6 හා සත 10 බැගින් වූ තියුණු පහත වැටීමෙක් දැක්වීය. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1964 අගෝස්තු 4 වැනි දින ඉරාකය විසින් තේ ආනයන වෙළෙඳාම රජය සතු කිරීමෙන් පැනනැගුනු තත්වයයි. ඉරාකය මැද පෙරදිග පෙදෙසෙහි ලංකාවේ තේ ප්‍රධාන වශයෙන් මිලදී ගන්නවා පමණක් නොව එම ප්‍රදේශය සඳහා වූ තේ අපනයනයන්ගෙන් අඩකටද වඩා මිලදී ගැනීමෙහි යෙදුනාය. ඉහත සඳහන් දින සිට ඉරාක රජයේ මිලදී ගැනීමේ මණ්ඩලය එම රටට තේ ආනයන කිරීමේ සම්පූර්ණ බලය පවරා ගත්තාය. මේ හා සමගම කොළඹ තේ වෙන්දේසියේදී ඉරාකය වෙනුවෙන් තේ මිලදී ගැනීම සම්පූර්ණයෙන්ම නැවතිනි. නැවතත් තේ මිලදී ගැනීම ආරම්භවූයේ ඉරාකයේ පුද්ගලික තේ වෙළඳාම වෙනුවට නව යන්ත්‍රණයක් ඇති කිරීමට ඉරාක රජයේ මිලදී ගැනීමේ මණ්ඩලයට හැකිවීමෙන් පසුව 1964 දෙසැම්බරයේ මුල් වකවානුවේදීය. මෙම සිදුවීම් වල බලාපොරොත්තු රහිත වේගවත් බවට මුහුණ දීමට දේශීය වෙළෙඳුනට නොහැකි වූයෙන් වර්ෂයේ අවසාන කාර්තුවේදී ඉරාකයට තේ අපනයනය කිරීමේ ක්‍රමවත් බව බිඳී ගියේය. ඉරාක තේ ආනයන ජනසතුව සිදුවූ අගෝස්තු මුල් කොටසේදී දේශීය නැව්ගත කරන්නාවුන්ගේ ගබඩා වල තේ රාත්තල් කෝටි 0·55 හා 0·6 අතර ප්‍රමාණයක් වූ බව වාර්තා විය. මේවා ඉරාක මිලදී ගන්නවුන් සමග ඇතිකරගත් ගිවිසුම් අනුව මිලදී ගෙන එම රටට නැව්ගත කිරීමට සූදානම් කොට තුබූ තේ තොගයන් විය. තේ අපනයනය කිරීම අපහසුවූයේ මෙම ගිවිසුම් වල නීත්‍යානුකූල භාවය පිළිබඳව පැනනැගුනු ගැටලු නිරාකරනය කර ගැනීමේ අපහසුව නිසා විය. මෙම කරුණද, එමෙන්ම ඉරාකයට තේ අපනයනය කිරීමේ අනාගත තත්වය පිළිබඳ අස්ථිර භාවයද, වසරේ අවසාන මාසවලදී රජයේ මෙන්ම පුද්ග ලික වෙළෙඳ අංශයේද මහත් සැලකිල්ලට බඳුන්ව තිබිනි. වසරේ පළමු නව මස තුළ රාත්තල් කෝටි 0·47 ක මාසික සාමාන්‍යයක් දැක්වූ ඉරාක තේ අපනයන පරිමාව ඔක්තෝබරයේදී රාත්තල් කෝටි 0·07 දක්වා අඩුවී, නොවැම්බරයේදී සම්පූර්ණයෙන්ම නැවතුනි. මෙම සිදුවීම් කොළඹ තේ වෙන්දේසියේ පහත් බිම් වගාවේ තේ මිල කෙරෙහි නොඅඩුව බල පෑවේය. ඉරාක වෙළෙඳ

පොල් සඳහා සුදුසු වූ තේ (උදා. බී. ඕ. පී. තේ) වර්ගවල මිල අනෙකුත් සෑම වර්ග වල තේ මිලට වඩා සීඝ්‍රයෙන් පහත වැටුනි. දෙසැම්බර් 7 වන දින කොළඹ දී පැවැත්වුනු තේ වෙන්දේසියේදී, සාමාන්‍ය ප්‍රමාණයකින් තේ මිලදී ගනිමින් ඉරාකය නැවත තේ වෙළෙඳ පොලට ඇතුලු වූවාය. මේ හේතුකොට ගෙන මෙම වර්ගයේ තේ මිලෙහි ක්‍රමවත් වැඩිවීමෙක් දක්නට ලැබුනි. කෙසේ වුව, වසරේ අවසන තෙක් එම රටට තේ අපනයනය කිරීම යථා තත්වයට පත්වීමේ ලකුණු දක්නට නොලැබුනි.

ලන්ඩන් තේ වෙන්දේසියේදී සියළු වර්ගයන්හි තේ මිල මේ වසරේදී පසුගිය වසරට වැඩි දියුණුවක් දැක්විය. මෙම වෙළෙඳ පොළෙහි සෑම වර්‍ගයන්හිම තේ වැඩි මිලකට විකුණුනි. සැම වර්ගයේම ලංකා තේ වල රාත්තලක සාමාන්‍ය මිල සිලිම් 4 පැන්ස 5·85 ක් විය. මෙය පසුගිය වසරට වඩා පැන්ස 1·52 ක වැඩිවීමෙක් දැක්විය. දකුණු ඉන්දීය තේ රාත්තලක සාමාන්‍ය මිල සිලිම් 3 පැන්ස 9·87 ක් වූයේ, වඩා තියුණු ලෙසකින් රාත්තලකට පැන්ස 2·52 ක වැඩිවීමෙක් දැක්විය. එසේ වතුදු, උතුරු ඉන්දිය තේ රාත්තලක සාමාන්‍ය මිල සිලිම් 4 පැන්ස 6·62 ක් වූයේ, රාත්තලකට පැන්ස 1·08 ක පහත වැටීමෙක් දැක්විය. මෙම වෙන්දේසියේ විකුණුනු සියලු තේ වර්ග වල රාත්තලක සාමාන්‍ය මිල සිලිම් 4 පැන්ස. 3·45 ක් වූයේ රාත්තලකට පැන්ස 0·80 ක සාමාන්‍ය වැඩිවීමෙක් දැක්විය.(1)

පසුගිය වසර කිහිපයේදී ලෝක තේ සැපයුම හා ඉල්ලුම ඉතා කිට්ටු සමබර තත්වයක පැවැතිනි. දැනට ලැබී ඇති ඇස්තමේන්තුවලින් පෙනී යන්නේ 1963 දී ලෝක තේ සැපයුම රාත්තල් කෝටි 163·0 ක් ද පාරිභෝජනය රාත්තල් කෝටි 164·3 ක්ද වූ බවය.(2) මේ අනුව, එම වසරේදී ලෝක පාරිභෝජනය සැපයුමට වඩා රාත්තල් කෝටි 1·3 කින් වැඩවිය. 1964 සඳහා සම්පූර්ණ සංඛ්‍යා තොරතුරු නොමැති නමුදු, තාවකාලික සංඛ්‍යා තොරතුරු අනුව, පෙනී යන්නේ තේ නිෂ්පාදනයෙහි යෙදෙන ප්‍රධාන රටවල 1963 ට වඩා රාත්තල් කෝටි 8·0 ක පමණ වැඩි නිෂ්පාදනයෙක් ඇතිවියහැකි බවය.(3) දකුණු ඉන්දියාවෙහි නිෂ්පාදනය රාත්තල් කෝටි 1·6 කින්ද, ලංකාවේ නිෂ්පාදනය රාත්තල් කෝටි 0·3 කින්ද පහත වැටුනු නමුදු, වයඹ දිග ඉන්දියාවෙහි නිෂ්පාදනය රාත්තල් කෝටි 6·8 කින්ද ,පකිස්ථානය, ඉන්දුනීසියාව හා අප්‍රිකාවෙහි නිෂ්පාදනය මඳ වශයෙන්ද වැඩිවීමෙන් එම පහත වැටීම පමණටත් වැඩියෙන් මැකී ගියේය. ප්‍රධාන පාරිභෝගිකයා මෙන්ම ප්‍රති අපනයනයෙහි යෙදෙන්නාවූද, එක්සත් රාජධානිය(4) 1964 දී ආනයනය කළ මුළු තේ ප්‍රමාණය රාත්තල් කෝටි 53·7 ක් වූයේ පසුගිය වසරට වඩා රාත්තල් කෝටි 2·6 ක පහත වැටීමෙක් දක්විය. වර්ෂාවසාන ඉතිරි තේ තොග රාත්තල් කෝටි 15·1 ක් වූයේ පසුගිය වසරට(5) වඩා රාත්තල් කෝටි 1·8 ක පහත වැටීමෙක් දක්විය. දැනට ඇති සාධක අනුව පෙනීයන්නේ 1964 දී ලෝක පාරිභෝජනයට වඩා ලෝක සැපයුමෙහි අතිරික්තයක් ඇතිවිය හැකි බවය. එසේ වුව එම අතිරික්තය සැපයුම හා ඉල්ලුම අතර පසුගිය වසර කිහිපයෙහිදී වූ පුළුල් සමබරතාවයට හානියක් ඇතිවන අන්දමේ විශාලත්වයකින් යුතු වේයයි සිතිය නොහැකිය.

---

(1) ලන්ඩන් තේ බ්‍රෝකර් වරුන්ගේ සංගමය — 1964 දෙසැම්බර් 30 දින ංක 653 දරන තේ වෙළෙඳ පොළ වාර්තාව.

(2) ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික සංඛ්‍යා ලේඛන සංග්‍රහය — 1964 ජුනි හා එම සංග්‍රහය සඳහා වූ 1964 දෙසැම්බර් අතිරේකය.

(3) 1965 ජනවාරි 1 දින "ඉන්වෙස්ටර්ස් ගාඩියන්—ටී ඇන්ඩ් රබර්මේල්" — 27 වැනි පිටුව.

(4) ලන්ඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය — 1965 පෙබරවාරි 5 දින අංක 658 දරන තේ වෙළෙඳ පොළ වාර්තාව.

(5) ලන්ඩන් තේ බ්‍රෝකර්වරුන්ගේ සංගමය—1965 ජනවාරි 8 දින අංක 654 දරණ තේ වෙළෙඳ පොළ වාර්තාව.

එනමුදු, නිෂ්පාදනය හා පාරිභෝජනය පිළිබඳ දිගුකල් හැඩගැස්ම පිළිබඳව සැලකිලිමත් වීමේ අවශ්‍යතාවය පෙනී යයි. සම්ප්‍රදායිකව නිෂ්පාදනයේ යෙදෙන රටවල මෙන්ම නැගෙනහිර අප්‍රිකාව දකුණු අමෙරිකාව වැනි අලුතින් නිෂ්පාදනයෙහි යෙදෙන රටවලද නිෂ්පාදනයෙහි අනුක්‍රම වැඩි වීමත්, එම රටවල නිෂ්පාදනය තවදුරටත් වැඩිවීමේ හැකියාවනුත් ගැන සලකන විට තේ සඳහා අනාගතය යහපත් සේ පිළිගත නොහැක. මෙම තත්වය විශෙෂයෙන්ම බලපාන්නේ මැදිබිම් වගාවේද සාමාන්‍ය වර්ගවල ද තේ පිළිබඳවය.

## රබර්

11 ආ–4 සංඛ්‍යා සටහන රබර් නිෂ්පාදනය, අපනයනය හා මිල පිළිබඳ විස්තර දක්වයි.

සංඛ්‍යා සටහන II ආ – 4

### රබර් නිෂ්පාදනය, අපනයනය සහ මිල

| වර්ෂය | නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ | අපනයන රාත්තල් දශලක්ෂ | රාත්තලක හැ. වි. ස. මිල රු. සත | ආර්. එස්. එස්. නො 1 රබර් සඳහා කොළඹ වෙළෙඳ පොලේ රාත්ත ලක මිල රු. සත |
|---|---|---|---|---|
| 1955 | 210 | 222 | 1·58 | 1·18 |
| 1956 | 214 | 193 | 1·52 | 1·45 |
| 1957 | 220 | 209 | 1·44 | 1·16 |
| 1958 | 224 | 207 | 1·25 | 0·93 |
| 1959 | 205 | 206 | 1·45 | 1·25 |
| 1960 | 218 | 235 | 1·61 | 1·24 |
| 1961 | 215 | 197 | 1·32 | 1·01 |
| 1962 | 229 | 224 | 1·29 | 0·98 |
| 1963 | 231 | 209 | 1·23 | 0·93 |
| 1964 | 246 | 253 | 1·15 | 0·90 |

සංඛ්‍යා—රබර් පාලක තැනගේ පාලන වාර්තා.

ලංකා රේගු වාර්තා.

කොළඹ රබර් වෙළෙඳුන්ගේ සංගමය.

1963 දී මඳ වශයෙන් කෝටි 0·2 ක වැඩිවීමෙක් දක්වූ රබර් නිෂ්පාදනය, මෙම වසරේදී ඉතා තියුණු ලෙස ප්‍රසාරණය වූයේය. රාත්තල් කෝටි 24·6 ක් වූ මුළු නිෂ්පාදනය පසුගිය වසරට වඩා රාත්තල් කෝටි 1·5 ක හෙවත් සියයට 7 ක වැඩිවීමෙක් දක්විය. නැවත වගාකළ ප්‍රදේශයන්ගේ නිෂ්පාදන කටයුතු ඇරඹීමත් යහපත් කාල ගුණයත් මෙම වැඩි නිෂ්පාදනයට හේතු විය. අපනයන පරිමාව මීට වැඩි වේගයකින් රාත්තල් කෝටි 25·3 දක්වා වැඩිවූයේ 1963 ට වඩා රාත්තල් කෝටි 4·4 ක නොහොත් සියයට 21 වැඩිවීමෙක් දක්වීය. කොළඹ වෙළෙඳ පොළෙහි ආර්. එස්. එස්. නො. 1 රබර්වල සාමාන්‍ය මිළ සත90 ක් වූයේ පසුගිය වසරට වඩා සත 3 ක පහත වැටීමෙක් දක්විය.

1964 වර්ෂයේ වැඩි කොටසක් තුළ ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි පැවතියේ උදාසීන හා අප්‍රාණික තත්වයෙකි. අග්නිදිග ආසියාවේ දේශපාලන අසහනය සහ ප්‍රාථමික වෙළෙඳ පොළවල රැසියානු රබර් මිලදී ගැනීම නිසා මිල කෙරෙහි මඳ වශයෙන් හිතකර බලපෑමක් ඇතිවිය. වසර තුළ මිලෙහි ස්ථාවර බවක් පැවතියේ මිල උච්චාවචනයන් ඉතා පටු සීමාවක් තුළ සිදුවිය. එසේ වුවද, මෙම කාලයේදී වූ මිලෙහි හැඩගැස්ම පහත වැටෙන සුළු වූවක් ඇත්ත වශයෙන්ම, කෘතිම රබර් වෙළෙඳ පොළෙහි බලපෑම් ඇති කරවීමට සමත් වූ කල්හි සිටම දිගු කල් මිල පහත වැටෙන සුළු හැඩගැස්මක් දක්විය. මෙය කෙටිකල් මිලෙහි පහත වැටීමෙක් ද

**ඇති කරවිය.** මිල පහත් කරවන අන්දමේ බලපෑමක් ඇතිවූයේ වර්ෂයේ මුල් එකොළොස් මස තුළදී සෝවියට් රුසියාවට රබර් ආනයනය කිරීම පසුගිය වසරේ එම කාල සීමාවේදී වූ, ටොන් 2,87,500[1] සිට ටොන් 1,37,000 දක්වා අඩුකිරීමයි.[2] ආර්. එස්. එස්. නො. 1 රබර් සඳහා ලන්ඩන් වෙළෙඳ පොලේ රාත්තලක සාමාන්‍ය මිල සිලිම් 1 පැන්ස 8 5/12 විය. මෙය 1963 දීට වඩා පැන්ස 1 1/3 ක පහත වැටීමෙක් විය. එම වසරේදී ඊට පෙර වසරට වඩා වැඩි, එනම් රාත්තලකට පැන්ස 1 9/16 ක පහත වැටීමක් දක්වීය. සිංගප්පූරු වෙළෙඳ පොළෙහි මෙම වර්ගයේ රාත්තලක සාමාන්‍ය මිල සිංගප්පූරු සත 68·17 ක් වූයේ පසුගිය වසරට වඩා සිංගප්පූරු සත 4.25 ක පහත වැටිමෙක් දක්විය. ඊට පෙර වසරේදී මිලෙහි පහත වැටීම ලන්ඩන් වෙළෙඳ පොළෙහි සිදු වූ අයුරින්ම එනම් වැඩි තියුණු බවකින් සිදුවූයේ රාත්තලක් සිංගප්පූරු සත 5·78 කින් පහත වැටිනි.

ජාත්‍යන්තර රබර් හැදෑරුම් මුලුවෙන් ලැබී ඇති අලුත්ම ඇස්තමේන්තු[3] අනුව 1964 ලෝක ස්වාභාවික රබර් නිෂ්පාදනය ටොන් 22,05,000 ක් වූයේ පසුගිය වසරට වඩා ටොන් 1,50,000 කින් හෙවත් සියයට 7 කින් වැඩි බවෙක් දක්වීය. ලෝක කෘතිම රබර් නිෂපාදනයේ වැඩිවීම ස්වාභාවික රබර් නිෂ්පාදනයේ වැඩිවීම මෙන් දෙගුණයක වේගයකින් සිදුවිය. කෘතිම රබර්වල මුළු නිෂ්පාදනය ටොන් 27,55,000 ක් වූයේ පසුගිය වසරට වඩා ටොන් 3,15,000 ක නොහොත් සියයට 13 ක වැඩිවීමෙක් දක්විය. මෙම ඇස්තමේන්තු වලින් පෙනී යන්නේ පසුගිය වසරේදී ටොන් 72,500 ක් වූ ස්වාභාවික රබර් හිඟය සමග සසඳන කල මෙම වසරේදී පාරිභෝජනයට වඩා සැපැයුමෙහි ටොන් 80,000 ක (නිදහස් කරන ලද රබර් තොගද ඇතුළුව) අතිරික් තයක් තිබූ බවය. කෘතිම රබර් සැපැයුම ඒවායේ පාරිභෝජනයට වඩා ටොන් 1,15,000 කින් වැඩිවූයේ, පසුගිය වසරේදීට වඩා ටොන් 15,000 ක වැඩිවීමෙක් දක්වීය. ලෝකයේ මුළු රබර් පාරිභෝජනයේ වූ ටොන් 3,10,000 ක වැඩිවීමෙන් ටොන් 3,00,000 ක් හෙවත් සියයට 97 ක් වූ කොටස කෘතිම රබර් පාරිභෝජනයේ වැඩිවීමෙක් විය.

මෙතෙක් ස්වාභාවික රබර්වලට පමණක් සීමාව තිබූ උපයෝගිතාවන් ක්‍රමයෙන් කෘතිම රබර් කෙරෙහිද විද්‍යමාන වෙයි. 1964 දී අලුත් කෘතිම රබර් වර්ගයන්හි උසස් බවෙහි වැඩි දියුණුවක් දක්නට ලැබුනා පමණක් නොව ඒවායේ වැඩි නිෂ් පාදනයෙක්ද මිලෙහි අඩුවීමෙක්ද දක්නට ලැබුනි. කාර්මික දියුණුවක් ලැබූ රට වල (එමෙන්ම, දියුණුවෙමින් පවත්නා රටවල) කෘතිම රබර් නිෂ්පාදනය සඳහා නිෂ්පාදන පහසුකම් හා නිෂ්පාදන හැකියාවන් කෙමෙන් වැඩිවන බව බව පෙනී යයි. මෙම පහසුකම් හා හැකියාවන් වැඩිවීම හා පෙට්‍රෝලියම් හා රසායන ද්‍රව්‍ය කර්මාන්තයේ වර්ධනය අතර සබඳකමක් පවතී. මේ හැරෙන්නට දැනටමත් පිහි ටුවා ඇති කෘතිම රබර් කම්හල් වල අතිරික්ත නිෂ්පාදන හැකියාවන් මැකී යන පරිදි නිෂ්පාදනය කිරීම සඳහා අළුත් වෙළෙඳ පොලවල් සෙවීම කළ යුතුව ඇත. මේ හැරෙන්නට පසුග්ය වර්ෂ කිහිපය තුල එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු වට ආනයනය කරන ලද ස්වාභාවික රබර් පරිමාව[4] අඩුවීමෙන් පෙනී යන්නේ එම රටෙහි ද කෘතිම රබර් නිෂ්පාදනය වැඩිවී ඇති බවය. මේ කරුණු සියල්ලෙන්ම පිළිබිඹු වන්නේ ඉදිරි අනාගතයේදී ස්වාභාවික රබර් මිලෙහි තව දුරටත් පහත වැටීමෙක් සිදුවිය හැකි බවය.

---

1. ජාත්‍යන්තර රබර් හැදෑරුම් මුලුවේ රබර් සංඛ්‍යා ලේඛන සංග්‍රහය. 1964 දෙසැම්බර්, 7 වැනි පිටුව.
2. වෙනත් අයුරකින් දක්වා නොමැති නම්, වාර්තාවේ මෙම ඡේදයෙහි සඳහන් ''ටොන්'' යන වචනයෙන් අදහස් කැරෙන්නේ දිගු ටොන්.
3. ජාත්‍යන්තර රබර් සංහිතාව. 1964 දෙසැම්බර්, 76 වැනි පිටුව.
4. එක්සත් සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවේ රබර් ආනයනයන් පහත දක්වෙන අයුරින් අඩුවී ඇත

| | | |
|---|---|---|
| 1961—ටොන් | | 3,63,750 |
| 1962—ටොන් | | 3,45,500 |
| 1963—ටොන් | | 2,92,750 |
| 1964—ටොන් | (මාස 11 සඳහා) | 1,37,000 |

සංඛ්‍යා—රබර් සංඛ්‍යා ලේඛන සංග්‍රහය
(ජාත්‍යන්තර රබර් හැදෑරුම් මුලුව)
1964 දෙසැම්බර්—7 වැනි පි ටුව

**පොල් නිෂ්පාදිත**

11 ආ–5 සංඛ්‍යා සටහන ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි අපනයන පරිමාව හා මිල දක්වයි.

සංඛ්‍යා සටහන 11 (ආ) 5

**ප්‍රධාන නෙල් නිෂ්පාදිත අපනයන පරිමාව සහ මිල**

| වර්ෂය | පරිමාව | | | | නැ. වි. ස. මිල | | |
|---|---|---|---|---|---|---|---|
| | පොල් තෙල් හොණ්ඩර දහස් ගණනින් | කොප්පරා හොණ්ඩර දහස් ගණනින් | කපාපු පොල් හොණ්ඩර දහස් ගණනින් | එකතුව (නිෂ්පාදනය සඳහා වැයවූ පොල් ප්‍රමා,) ගෙඩි දස ලක්ෂ | පොල්තෙල් ටොන් එකක මිල රු සත | කොප්පරා පාරමක* මිල රු සත | කපාපු පොල් රාත්තලක මිල රු සත |
| 1955 .. | 1,945 | 1,367 | 1,157 | 1,531 | 1,156·20 | 209·50 | 0·42 |
| 1956 .. | 1,698 | 1,155 | 1,275 | 1,418 | 1,618·40 | 212·15 | 0·45 |
| 1957 .. | 1,081 | 695 | 978 | 950 | 1,256·00 | 239·75 | 0·50 |
| 1958 .. | 887 | 554 | 1,135 | 890 | 1,396·00 | 264·85 | 0·57 |
| 1959 .. | 1,389 | 852 | 1,050 | 1,140 | 1,688·20 | 302·60 | 0·64 |
| 1960 .. | 1,110 | 583 | 1,099 | 976 | 1,436·60 | 276·15 | 0·58 |
| 1061 .. | 1,837 | 1,100 | 967 | 1,355 | 1,163·20 | 217·35 | 0·44 |
| 1962 .. | 2,043 | 1,448 | 981 | 1,530 | 1,101·60 | 203·70 | 0·51 |
| 1963 .. | 1,621 | 862 | 967 | 1,208 | 1,220·80 | 227·75 | 0·55 |
| 1964 .. | 2,351 | 1,162 | 1,080 | 1,618 | 1,308·40 | 237·20 | 0·53 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා වලින්.

* පාරම 1 = හො: 5.

1963 දී අපනයන කළ ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි මුළු පරිමාව සියයට 21 ක පහළ වැටීමෙක් දක්විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ අයහපත් කාලගුණය හේතුකොට පොල් නිෂ්පාදනය පහත වැටීමයි. 1964 දී නිෂ්පාදනයෙහි වැඩිවීමෙක් වූ අතර, මෙම නිෂ්පාදිතයන්ගේ මුළු අපනයන පරිමාව ගෙඩි පොල් කෝටි 161·8 ක් වූයේ පසුගිය වසරට වඩා තියුණු ලෙස සියයට 34 කින් ප්‍රසාරණය විය. පොල් තෙල් අපනයන පරිමාව සියයට 45 කින් වැඩිවූ අතර, අඩු වේගයකින් ප්‍රසාරණය වූ කොප්පරා හා පොල්තෙල් අපනයන පිළිවෙලින් සියයට 35 ක හා සියයට 12 ක වැඩිවීමෙක් දක්විය.

1963 දී පොල්තෙල් හා කොප්පරාවල සාමාන්‍ය නැ. වි. ස. මිල පිළිවෙලින් සියයට 11 හා සියයට 12 බැගින් වැඩිවිය. මෙම මිල 1964 දී එතරම් දැඩි නොවූ වේගයකින් පිළිවෙලින් සියයට 7 කින් හා සියයට 4 කින් වැඩි විය. 1963 දී සියයට 8 කින් වැඩිවූ කපාපු පොල්වල සාමාන්‍ය නැ. වි. ස. මිල මෙම වසරේදී සියයට 4 ක පහත වැටීමෙක් දක්විය. මෙම නිෂ්පාදිතයන් සඳහා කොළඹ වෙළෙඳ පොළෙ මිල හැඩ ගැස්ම මෙම වෙනස්වීම් වලින් පිළිබිඹු විය. මෙම වෙළෙඳ පොළෙ පොල් මිලෙහි අනුක්‍රම දියුණුවක් ඇතිවූයේ, සෑම කාර්තුවකම සාමාන්‍ය මිල ඊට පෙර කාර්තුවෙහි සාමාන්‍ය මිලට වඩා කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙම වසරේ පොල්තෙල් ටොන් එකක සාමාන්‍ය මිල රුපියල් 1,087.69 ක් විය. මෙය

පසුගිය වසරට වඩා ටොන් එකකට රුපියල් 58·95 ක හෙවත් සියයට 6 ක වැඩිවීමෙක් දක්විය. කොප්පරා මිලද පොල්තෙල් මිල අනුගමනය කළද එම මිලෙහි එතරම් තියුණු වැඩිවීමෙක් දක්නට නොලැබුනි. 1963 මුල් අඩෙහි මිල මට්ටමට වඩා මෙම වසරේ එම අඩෙහි මිල මට්ටම බොහෝ දුරට අඩු බවෙක් දක්විය. මෙම වසරේදී කොප්පරා පාරමක සාමාන්‍ය මිල රුපියල් 167·78 ක් වූයේ පසුගිය වසරේ මිලට වඩා වැඩි වෙනසක් නොදක්විය. කපාපු පොල්වල සාමාන්‍ය මිල රාත්තලකට සත 40 ක් වූයේ පසුගිය වසරේදීට වඩා රාත්තලකට සත 4 ක නොහොත් සියයට 9 ක අඩුවීමක් දක්විය. ලන්ඩන් වෙළෙඳ පොළෙහි ලංකා පොල්තෙල් සඳහා ටොන් එකක සාමාන්‍ය මි. ර. ගැ. මිල පවුම් 107½ ක් වූයේ පසුගිය වසරට වඩා පවුම් 5 ක හෙවත් සියයට 5 ක වැඩිවීමෙක් දැක්විය.

ආහාරයට ගන්නා තෙල් වර්ග සඳහා මෙම වසරේ ජාත්‍යන්තර වෙළෙඳ පොළවල ඉහළ මිල මට්ටමක් පැවතිනි. ඉතා වැඩි ලාභ ලැබූයේ රටකජු තෙල් හා සෝයා බෝංචි තෙල් වැනි මෘදු තෙල් වර්ග විසිනි. පොල් තෙල් ඇතුළු එම ගණයේ අනෙකුත් තෙල් වර්ග ද, මෘදු තෙල්වල වැඩිවූ ඉල්ලුම අනුව සලකන විට ඇතිවූ සීමිත සැපයුමෙන් මිල ඉහළ යාමේ හේතුවෙන් ප්‍රයෝජන ලැබිය. මත්ස්‍ය තෙල් වර්ගයන්ගේ හිඟ බවෙක් නිසා ද, 1964/65 මධ්‍යදරණී ඔලිව් තෙල් නිෂ්පාදනය අඩුවීමේ බලාපොරොත්තු නිසා ද, 1964 ජූලි 11 වැනි දින ඉන්දියාව රටකජු තෙල් අපනයනය අත්හිටුවීම නිසා ද මිල වැඩිවීම තහවුරු විය.

**ආනයන**

රේගු වාර්තා වලින් පිළිබිඹු වන පරිදි ආනයන ප්‍රධාන වර්ග අනුව සහ භාණ්ඩ හෝ භාණ්ඩ ගණ අනුව වර්ගකොට 11 ආ–6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

මෙම වසරේ දී ආනයන වටිනාකම රුපියල් කෝටි 48·5 කින්(1) හෙවත් සියයට 38 කින් ප්‍රාසාරණය විය. පසුගිය වසරේ දී මුළු ආනයන වටිනාකම රුපියල් කෝටි 17·0 ක හෙවත් සියයට 10 පහත වැටීමෙක් දක්විය. වැඩි වූ ආනයන මුළුමනින්ම පාරිභෝජන භාණ්ඩ ගණයට අයත් වූයේ විය. 1963 ආනයනයන්ට වඩා රුපියල් කෝටි 48.2 කින් හෙවත් සියයට 62 කින් මෙම ගණයේ භාණ්ඩ ආනයන වැඩි වී ඇත. මුළු ආනයන අතර පාරිභෝජන භාණ්ඩවල කොටස පසුගිය වසර තුනෙහි සාමාන්‍ය වැඩිවීම වූ සියයට 55 ටද වැඩියෙන් සියයට 64 කින් වැඩි විය. 'අන්තර් භාණ්ඩ රුපියල් කෝටි 2.5 කින් හෙවත් සියයට 7 කින් වැඩි විය. මුළු ආනයනයන්ගෙන් සියයට 20 ක්වූ මෙම ගණයේ ආනයන පසුගිය වසරට වඩා සියයට 5 ක පහත වැටීමෙක් දක්විය. ආයෝජන භාණ්ඩ වසරට රුපියල් කෝටි 1·9 කින් හෙවත් සියයට 6 කින් පහත වැටුනි. මුළු ආනයනයන්ගෙන් එයට අයත් කොටස සියයට 15 ක් වූයේ මෙම වසර කිහිපයේ දී වූ පහත් ම මට්ටම විය. මෙය පසුගිය වසරේ දී වූ සියයට 22 ට වඩා අඩු බවෙක් දක්විය.

'පාරිභෝජන භාණ්ඩ' ගණයෙහි 'ආහාරපාන' ආනයන රුපියල් කෝටි 37·9 කින් හෙවත් සියයට 60 කින් ප්‍රාසාරණය විය. රජයේ සහල්, තිරිඟු, පිටි හා සීනි ආනයන රුපියල් කෝටි 32·6 කින් වැඩි වූයේ 'ආහාරපාන 'ආනයනයන්ගේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතුවිය. මුළු ආනයනයන් අතර 'ආහාරපාන' වල කොටස සියයට 51 ක් විය. පසුගිය වසර 5 තුළ දී මෙම කොටසේ සාමාන්‍යය සියයට 40 ක් විය. කඩල, ඇට වර්ග සහ කුළුබඩු, රුපියල් කෝටි 2·7 කින් හෙවත් සියයට 24 වැඩිවීමෙක් දක්විය. 'කිරි හා කිරි නිෂ්පාදිත' රුපියල් කෝටි 1·7 කින් හෙවත් සියයට 22 කින් වැඩි විය.

1. 47 වැනි පිටුවෙහි අධෝ ලිපිය බලන්න.

සංඛ්‍යා සටහන II (ආ) 6

## ආනයන—ප්‍රධාන භාණ්ඩ ගණ සහ භාණ්ඩ හෝ භාණ්ඩ වර්ග වශයෙන් 1959-1964.

| | වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | | | මුළු ආනයන වලින් සියයට ගණන | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 | 1959 | 1960 | 1961 | 1962 | 1963 | 1964 |
| **1. පාරිභෝගික භාණ්ඩ** .. | **1,203** | **1,195** | **972** | **906** | **781** | **1,263** | **60·0** | **61·0** | **57·1** | **54·6** | **52·4** | **63·9** |
| (අ) ආහාර පාන .. .. .. | 800 | 752 | 672 | 630 | 629 | 1,008 | 39·9 | 38·4 | 39·5 | 38·0 | 42·2 | 51·0 |
| (i) සහල් .. .. .. | 283 | 242 | 217 | 195 | 192 | 326 | 14·1 | 12.3 | 12·7 | 11·7 | 12·9 | 16·5 |
| (ii) පිටි .. .. .. | 106 | 65 | 69 | 71 | 60 | 137 | 5·3 | 3·3 | 4·1 | 4·3 | 4·0 | 6·9 |
| (iii) අ. සීනි—සුදු .. .. | 59 | 65 | 77 | 56 | 70 | 185 | 2·9 | 3·3 | 4·5 | 3·4 | 4·7 | 9·4 |
| ආ. සීනි, අනෙකුත් (සක්කරා, හකුරු හා සූකිරි .. .. .. | 16 | 14 | 1 | 2 | 3 | 2 | 0·8 | 0·7 | 0·1 | 0·1 | 0·2 | 0·1 |
| (iv) කිරි සහ කිරි නිෂ්පාදිත .. .. | 78 | 72 | 66 | 76 | 77 | 94 | 3·9 | 3·7 | 3·9 | 4·6 | 5·2 | 4·8 |
| (v) මස්, මාළු සහ බිත්තර .. .. | 99 | 115 | 77 | 62 | 65 | 74 | 4·9 | 5·9 | 4·5 | 3·7 | 4·4 | 3·7 |
| (vi) කඩල, ඇට වර්ග සහ කුළු බඩු .. | 94 | 113 | 113 | 117 | 112 | 139 | 4·7 | 5·8 | 6·6 | 7·0 | 7·5 | 7·0 |
| (vii) බීම සහ සකස් කළ දුම්කොළ .. .. | 15 | 14 | 10 | 5 | 5 | 3 | 0·7 | 0·7 | 0·6 | 0·3 | 0·3 | 0·2 |
| ආ. රෙදි පිළි (පිළියෙල කළ ඇඳුම් ඇතුලුව) .. | 179 | 196 | 172 | 149 | 83 | 165 | 8·9 | 10·0 | 10·1 | 9·0 | 5·6 | 8·4 |
| ඇ. අනෙකුත් පාරිභෝගික භාණ්ඩ .. .. .. | 224 | 247 | 128 | 127 | 69 | 90 | 11·2 | 12·6 | 7·5 | 7·7 | 4·6 | 4·6 |
| (i) මෝටර් රථ .. .. .. | 50 | 53 | 8 | 2 | 2 | 3 | 2·5 | 2·7 | 0·5 | 0·1 | 0·1 | 0·2 |
| (ii) ඔරලෝසු .. .. .. | 19 | 31 | 3 | 2 | ... | ... | 0·9 | 1·6 | 0·2 | 0·1 | ... | ... |
| (iii) ගුවන් විදුලි යන්ත්‍ර .. .. .. | 10 | 12 | 3 | 1 | ... | ... | 0·5 | 0·6 | 0·2 | 0·1 | ... | ... |
| (iv) රබර් ටයර් සහ ටියුබ් .. .. | 9 | 9 | 7 | 8 | 5 | 4 | 0·4 | 0·5 | 0·4 | 0·5 | 0·3 | 0·2 |
| (v) ඖෂධ සහ ඖෂධීය සංයෝග .. .. .. | 32 | 32 | 27 | 25 | 20 | 26 | 1·6 | 1·6 | 1·6 | 1·5 | 1·3 | 1·3 |
| **2. අන්තර් භාණ්ඩ** .. | **396** | **397** | **383** | **409** | **372** | **397** | **19·8** | **20·3** | **22·5** | **24·6** | **25·0** | **20·1** |
| (i) පොහොර වර්ග .. .. .. | 61 | 58 | 57 | 60 | 68 | 78 | 3·0 | 3·0 | 3·3 | 3·6 | 4·6 | 3·9 |
| (ii) පෙට්‍රොලියම් නිෂ්පාදිත .. .. | 135 | 124 | 127 | 126 | 119 | 93 | 6·7 | 6·3 | 7·5 | 7·6 | 8·0 | 4·7 |
| (iii) ගල් අඟුරු .. .. .. .. | 11 | 17 | 9 | 9 | 9 | 12 | 0·5 | 0·9 | 0·5 | 0·5 | 0·6 | 0·6 |
| (iv) රසායනික ද්‍රව්‍ය සහ සංයෝග .. .. | 26 | 28 | 27 | 33 | 32 | 37 | 1·3 | 1·4 | 1·6 | 2·0 | 2·1 | 1·9 |
| (v) ඩයි වර්ග, ඔපදමන ද්‍රව්‍යහා පාට වර්ග .. | 13 | 12 | 11 | 15 | 10 | 12 | 0·6 | 0·6 | 0·6 | 0·9 | 0·7 | 0·6 |
| (vi) තේ හා අනෙකුත් ලී පෙට්ටි .. .. | 13 | 13 | 14 | 16 | 15 | 15 | 0·6 | 0·7 | 0·8 | 1·0 | 1·0 | 0·8 |
| (vii) කඩදාසි හා කඩදාසි බෝඩ .. .. | 31 | 35 | 32 | 32 | 27 | 35 | 1·5 | 1·8 | 1·9 | 1·9 | 1·8 | 1·8 |
| (viii) කැට නූල් හා නූල් .. .. .. | 21 | 25 | 23 | 22 | 13 | 22 | 1·0 | 1·3 | 1·4 | 1·3 | 0·9 | 1·1 |
| (ix) සකස් නොකළ දුම්කොල .. .. | 11 | 11 | 12 | 10 | 9 | 7 | 0·5 | 0·6 | 0·7 | 0·6 | 0·6 | 0·4 |
| **3. ආයෝජන භාණ්ඩ** .. | **389** | **355** | **339** | **337** | **324** | **305** | **19·4** | **18·1** | **19·9** | **20·3** | **21·7** | **15·4** |
| (i) ගොඩනැගිලි උපකරණ .. .. | 88 | 100 | 89 | 100 | 77 | 93 | 4·4 | 5·1 | 5·2 | 6·0 | 5·2 | 4·7 |
| (ii) ගමනා ගමන උපකරණ .. .. | 146 | 118 | 100 | 92 | 100 | 58 | 7·3 | 6·0 | 5·9 | 5·5 | 6·7 | 2·9 |
| (iii) යන්ත්‍රෝපකරණ .. .. .. | 134 | 119 | 138 | 133 | 138 | 145 | 6·7 | 6·1 | 8·1 | 8·0 | 9·3 | 7·3 |
| **4. ඉහත ශීර්ෂවල (1, 2, හා 3) එකතුව** | **1,988** | **1,947** | **1,694** | **1,652** | **1,477** | **1,965** | **99·2** | **99·3** | **99·5** | **99·5** | **99·1** | **99·5** |
| **5. වර්ග නොකළ ආනයන** .. | **17** | **13** | **9** | **8** | **13** | **10** | **0·8** | **0·7** | **0·5** | **0·5** | **0·9** | **0·5** |
| **6. මුළු ආනයන** .. | **2,005** | **1,960** | **1,703** | **1,660** | **1,490** | **1,975** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** | **100·0** |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා

වර්ග නොකළ ආනයනයන් ප්‍රධාන භාණ්ඩ ගණ හෝ වර්ගවලට ඇතුළත් කිරීම සඳහා 1959 සිට 1963 දක්වා ආනයන කරන ලද භාණ්ඩ බොහොමයක් පිළිබඳව ඉහත සටහනේ දක්වා ඇති සංඛ්‍යා සැලකිය යුතු අන්දමින් (මේවා එම වර්ෂවල වාර්ෂික එවාර්තාවන්හි සඳහන් විය) ප්‍රතිශෝධනය කොට ඇත.

සහල්, තිරිඟු පිටි සහ සීනි ආනයන පිළිබඳව.වෙසෙසින්ම සඳහන් කළ යුතු වෙයි. ඉහතින්ද සඳහන් කළ පරිදි රේගු වාර්තාවන්හි සඳහන් මෙම ආනයන අතර ද ආහාර කොමසාරිස්වරයා වෙත ලැබුනු භාණ්ඩ අතර ද ප්‍රමාණවත් වෙනසක් තිබිය හැකිය. 1963 හා 1964 සඳහා මෙම වෙනස පහත සඳහන් සංඛ්‍යා වලින් දක්වෙයි:

ප්‍රමාණය ... ( ප්‍ර ) = ටොන් දහස් ගණනින්
වටිනාකම .... ( ව ) = රුපියල් දස ලක්ෂ
ඒකකයක මි, ගැ. මිල (මි) ටොන් එකක් රුපියල්

| | | ආහාර කොමසාරිස්වරයාගේ සංඛ්‍යා | | | | රේගු වාර්තා | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1963 | 1964 | වෙනස | | 1963 | 1964 | වෙනස | |
| | | | | මුළු | % | | | මුළු | % |
| සහල් — | ප්‍ර | 510 | 547 | + 37 | + 7·3 | 397 | 648 | +251 | + 63·2 |
| | ව | 250 | 283 | + 33 | +13·2 | 192 | 326 | +134 | + 69·8 |
| | මි | 490·30 | 517·48 | + 27·18 | + 5·5 | 485·11 | 503·91 | + 18·80 | + 3·9 |
| තිරිඟු පිටි* — | ප්‍ර | 206 | 225 | + 19 | + 9·2 | 137 | 308 | +171 | +124·8 |
| | ව | 85 | 100 | + 15 | +17·6 | 60 | 137 | + 77 | +128·3 |
| | මි | 414·06 | 442·57 | + 28·51 | + 6·9 | 436·96 | 445·82 | + 8·86 | + 2·0 |
| සීනි — | ප්‍ර | 199 | 208 | + 9 | + 4·5 | 138 | 220 | + 82 | + 59·4 |
| | ව | 125 | 174 | + 49 | +39·2 | 70 | 185 | +115 | +164·3 |
| | මි | 627·70 | 836·21 | +208·51 | +33·2 | 507·52 | 842·13 | +334·61 | + 65·9 |
| සහල්, තිරිඟු පිටි හා සීනි වල මුළු වටිනාකම | | 460 | 557 | +97 | + 21·1 | 322 | 648 | +326 | +101·2 |

සංඛ්‍යා: ආහාර කොමසාරිස්දෙපාර්තමේන්තුව හා ලංකා රේගු වාර්තා

1. 1964 තිරිඟු පිටි ආනයනය පිළිබඳ ආහාර කොමසාරිස්ගේ සංඛ්‍යා තාවකාලිකය.

මෙයින් පෙනී යන්නේ රේගු වාර්තාවන්හි සංඛ්‍යා ආහාර කොමසාරිස්වරයා විසින් 1963 දී ඇත්ත වශයෙන් ම කළ ආනයනයන්ට වඩා රුපියල් කෝටි 13.8 කින් අඩු තක්සේරුවක් දක්වන අතර 1964 ආයතනයන් රුපියල් කෝටි 9·1 කින් අධිතක්සේරු කොට දක්වන බවයි. රේගු වාර්තාවන්හි සංඛ්‍යා අතර හා ආහාර කොමසාරිස්වරයාගේ වාර්තාවන් අතර, සම්පූර්ණ සමානත්වයක් වූයේ නම් සහල්; තිරිඟු පිටි හා සීනි ආනයනයන්ගේ මුළු වටිනාකම 1964 දී කෝටි 64.8 ක් නොව රුපියල් කෝටි 55·7 ක් විය යුතු විය. මේ අනුව පසුගිය වසරට එම ආනයනයන් වැඩි වනු ඇත්තේ රේගු වාර්තාවන්හි සඳහන් වන අයුරු සියයට 101 කින් නොව සියයට 21 කින් පමණි. මේ අනුව රේගු වාර්තාවන්හි සඳහන් වනවාට වඩා ඉතා අඩු පමණෙකින් මුළු අපනයනයන් අතර මෙම ආනයනයන්ගේ කොටස සඳහන් විය යුතුය. මේ හැරෙන්නට මෙම සංඛ්‍යා තොරතුරුවල අසමතාවය, භාණ්ඩ පරිමාව හා මිල සංඛ්‍යා කෙරෙහි ද බලපායි. ආහාර කොමසාරිස්වරයා වෙත ලැබුනු සහල් තිරිඟු පිටි හා සීනි ආනයන පරිමාව 1963 ට වඩා පිළිවෙළින් සියයට 7, සියයට 9 හා සියයට 5 බැගින් වැඩි විය. එනමුදු, රේගු වාර්තාවන්හි සංඛ්‍යා අනුව පෙනී යන්නේ මේවා පිළිවෙළින් සියයට 63, සියයට 125 හා සියයට 59 බැගින් වැඩි වූ බවය. මෙම අසමතාවය නිසා මිල කෙරෙහි ඇති කරවන බලපෑම් ද වැදගත් වෙයි. මෙය වෙසෙසින්ම බලපාන්නේ සීනි පිළිබඳවය. 1964 ආනයන කළ සහල් හා තිරිඟු පිටි සඳහා වූ මි. ගැ. සහිත මිලෙහි පිළිවෙළින් සියයට 6 ක හා සියයට 7 ක වැඩිවීමෙක් සිදුවී ඇති බව ආහාර කොමසාරිස්ගේ ආනයන සංඛ්‍යා ලේඛනවලින්

පෙනීයයි. රේගු වාර්තාවන්හි ඇතුලත් සංඛ්‍යා වලින් දක්වෙන්නේ මෙම මිලෙහි පිළිවෙළින් සියයට 4 ක හා සියයට 2 ක වැඩිවීම් සිදු වූ බවය. අනෙක් අතට, ආහාර කොමසාරිස්වරයා විසින් සීනි සඳහා ගෙවන ලද මි. ගැ. සහිත මිල සියයට 33 ක වැඩිවීමෙක් දක් වූ අතර, රේගු වාර්තාවන්හි සංඛ්‍යාවලින් පෙන්නුම් කරනුයේ සියයට 66 ක වැඩිවීමෙකි.

ආහාර කොමසාරිස් විසින් 1964 ආනයනයන් සඳහා ගෙවා ඇති වැඩි මි. ගැ සහිත මිල වසරෙහි මුළු ආනයන මිලෙහි වැඩිවීමෙක් ඇති කර වූ ප්‍රධාන සාධකයක් වෙයි. ඇත්ත වශයෙන් ම, 1963 දී වූ මිල මට්ටම පැවතියේ නම් ඔහුගේ සහල්, තිරිඟු පිටි හා සීනි ආනයනයන්ගේ වටිනාකම පිළිවෙළින් රුපියල් කෝටි 1.5, රුපියල් කෝටි 0·7 හා රුපියල් කෝටි 4·3 යනුවෙන් රුපියල් කෝටි 6.5 ක පහත වැටීමෙක් සිදුවීමට ඉඩ තිබුණි.

පාරිභෝජන භාණ්ඩ ගණයෙහි ඉතිරි උපකරණ දෙකින් 'රෙදිපිළි'[1] ආනයන රුපියල් කෝටි 8·2 කින් හෙවත් සියයට 99 කින් ද, 'අනෙකුත් පාරිභෝජන භාණ්ඩ රුපියල් කෝටි 2.1 කින් හෙවත් සියයට 30 කින් ද වැඩි වී ඇත. 'අනෙකුත් පාරිභෝජන භාණ්ඩ' වටිනාකමෙහි ඇතුලත් රුපියල් කෝටි 0·6 ක වටිනාකමින් දක්වෙනුයේ පසුගිය වසරට වඩා සියයට 30 කින් වැඩි වූ ඖෂධ හා ඖෂධීය සංයෝගයන්ගේ ආනයන වටිනාකමය.

'අන්තර් භාණ්ඩ' ගණයෙහි පොහොර වර්ග ආනයනයන් රුපියල් කෝටි 1·0 කින් හෙවත් සියයට 15 කින් වැඩිවීමෙක් දැක්වූයේ හොණ්ඩරයක සාමාන්‍ය මි. ගැ. ඒකක මිල රුපියල් 12.39 ක් විය. මෙය පසුගිය වසරට වඩා හොණ්ඩරයකට රුපියල් 1.76 ක හෙවත් සියයට 17 ක වැඩිවීමෙක් දැක්විය. සැලකිය යුතු අනෙ-කුත් වෙනස්වීම් දැක්වූයේ රුපියල් කෝටි 0·8 ක හෙවත් සියයට 30 ක වැඩිවීමෙක් දැක්වූ 'කඩදසි හා කඩදසිබෝඩ්' වල ද, රුපියල් කෝටි 0·9 ක හෙවත් සියයට 69 ක වැඩිවීමෙක් දැක්වූ 'කැටිනූල් සහ නූල්' වල ද විය. රේගු වාර්තාවන්හි සඳහන් වන පරිදි පෙට්‍රෝලියම් නිෂ්පාදකයන්ගේ ආනයනය සැලකිය යුතු පමණෙකින් එනම් රුපියල් කෝටි 2.6 කින් හෙවත් සියයට 22 කින් අඩුවීමෙක් දැක්විය. මෙම ආනයනයන්ගේ සාමාන්‍ය මි. ර. ගැ. ඒකක මිල ගැලුමකට සත 42 ක් වූයේ පසුගිය වසරට වඩා ගැලුමක් සත 8 කින් හෙවත් සියයට 16 කින් පහත වැටීමෙක් දැක්විය.

'ආයොජන භාණ්ඩ' ගණයෙහි, 'ගොඩනැගිලි උපකරණ' සහ 'යන්ත්‍රෝප කරණ' පිළිවෙළින් රුපියල් කෝටි 1.6 කින් හෙවත් සියයට 21 කින් ද, රුපියල් කෝටි 0·7 කින් හෙවත් සියයට 5 කින් ද වැඩිවීම් දැක්විය. කෙසේ වුව ද, 'ගමනාගමන උපකරණ' ආනයනයන්හි රුපියල් කෝටි 4.2 ක හෙවත් සියයට 42 ක ඉතා අඩුවීමෙක් සිදු විය.

**වෙළෙඳම පැවැති ආකාරය.**

II වන පරිශිෂ්ටයෙහි 36 වන සංඛ්‍යා සටහන ප්‍රධාන මුදල් කලාප හා ප්‍රදේශ අනුව වෙළෙඳම පැවැති ආකාරය පෙන්නුම්කරයි.

---

1. 1963 හා 1964 සඳහා නිකුත් කළ ආනයන සලාකයන් අනුව මෙම වසර දෙක අතරෙහි "රෙදිපිළි, ආනයනයන්හි වැඩිවීමෙක් පිළිබිඹු නොකෙරේ. 1963 දී ලැබුනු හෝ එසේ නැතහොත් ලැබෙන්නට තිබුනු ආනයන ඊළඟ වසරෙහි රේගු වාර්තාවල සඳහන් වී තිබීම මෙයට හේතු වූවා විය හැකිය.

1964 දී සියළු මුදල් කලාපයන්ට හා ප්‍රදේශයන්ට කරන ලද ආනයනයන්හි වටිනාකමේ සැලකිය යුතු වෙනස්වීම් දක්නට ලැබිනි. ඩොලර් කලාපයට කරන ලද අපනයන පසුගිය වසරට වඩා ඉතා සුළු අඩුවීමෙක් දැක්විය. මෙම කලාප හා ප්‍රදේශ සියල්ලෙන් ම කරන ලද ආනයනයන්ගේ වටිනාකමෙහි වැඩිවීමෙක් විය.

රන්පවුම් කලාපයට යැවුනු අපනයන රුපියල් කෝටි 101.9 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 2.9 කින් හෙවත් සියයට 3 ක වැඩි බවෙක් දැක්විය. එනමුදු ලංකාවේ අපනයන ප්‍රමාණයෙන් එහි කොටස සියයට 54 ක් වූයේ පසුගිය වසරට වඩා සියයට 5 අඩු බවෙක් දැක්විය. මෙම කලාපයෙන් ආනයන කළ භාණ්ඩයන්ගේ වටිනාකම රුපියල් කෝටි 94.1 ක් වූයේ වඩා තියුණු ලෙස රුපියල් කෝටි 21.2 කින් හෙවත් සියයට 29 කින් වැඩි විය. කෙසේ වුව ද, මුළු ආනයනයන්ගෙන් මෙම කලාපයට අයත් වූ සියයට 48 ක කොටස පසුගිය වසරට වඩා සියයට 3 කින් පහත වැටීමෙක් දැක්විය. මෙම කලාපය සමග වෙළෙඳමෙන් ඇතිවුනු වෙළෙඳ අතිරික්තය රුපියල් කෝටි 7.9 ක් වූයේ පෙර වසරට වඩා කෝටි 18.4 කින් තියුණු ලෙස පහත වැටිනි. ඩොලර් කලාපයට යැවුනු අපනයනයන් රුපියල් කෝටි 22.0 ක් වූයේ රුපියල් කෝටි 0.2 කින් හෙවත් සියයට 1 කින් පහත වැටිනි. මෙම කලාපයෙන් ආනයන වූ භාණ්ඩ රුපියල් කෝටි 7.7 කින් වැඩි වටිනාකමෙක් දැක්වූයේ පෙර වසරට වඩා රුපියල් කෝටි 0.5 කින් හෙවත් සියයට 8 කින් වැඩි විය. මුළු අපනයනයන්ගෙන් හා ආනයනයන්ගෙන් මෙම කලාපය සතුව පැවති කොටස් පිළිවෙළින් සියයට 12 ක් හා සියයට 4 ක් විය. මෙම කොටස්වල පසුගිය වසරට වඩා සුළු අඩුවීම් දක්නට ලැබුනි. මෙම කලාපය සමග වෙළෙඳමෙන් ඇති වූ අතිරික්තය රුපියල් කෝටි 14.4 ක් විය. මෙය 1963 ට වඩා රුපියල් කෝටි 0.8 ක අඩුවීමෙකි.

පොදු රාජ්‍ය මණ්ඩලයට කෙරුනු අපනයන රුපියල් කෝටි 94.8 ක් වූයේ රුපියල් කෝටි 1.9 කින් හෙවත් සියයට 2 කින් වැඩිවිනි. ආනයන වටිනාකම රුපියල් කෝටි 74.6 ක් වූයේ පෙර වසරට වඩා රුපියල් කෝටි 11.8 ක හෙවත් සියයට 19 ක වැඩිවීමෙක් දැක්විය. මුළු අපනයනයන් හා ආනයනයන් අතර පොදු රාජ්‍ය මණ්ඩලය සතු කොටස පිළිවෙළින් සියයට 51 ක් හා සියයට 38 ක් විය. පසුගිය වසරට වඩා පිළිවෙළින් සියයට 6 ක හා සියයට 10 ක අඩුවීමෙක් දැක්විය. පොදු රාජ්‍ය මණ්ඩලය සමග වෙළෙඳමෙන් රුයපිල් කෝටි 20.2 ක අතිරික්තයක් ලංකාවට අයත් විය. මෙය 1963 ට වඩා රුපියල් කෝටි 9.9 ක අඩුවෙක් විය.

පසුගිය වසර සමග සසඳන කළ මෙම වසරේ දී 'යුරෝපීය ආර්ථික ප්‍රජාව' ට අපනයන කළ භාණ්ඩවල වටිනාකම වූ රුපියල් කෝටි 16.8, රුපියල් කෝටි 1.1 ක හෙවත් සියයට 7 ක වැඩිවීමෙක් දැක්විය. 'ප්‍රජාවෙන්' එවුනු ආනයන රුපියල් කෝටි 23.0 ක් වූයේ රුපියල් කෝටි 6.3 කින් හෙවත් සියයට 38 කින් වඩා තියුණු ලෙස පහත වැටිනි. මුළු අපනයන හා ආනයන අතර, ප්‍රජාව සතුව පැවති පිළිවෙළින් සියයට 9 හා 12 වූ කොටස් පෙර වසරට වඩා ඉතා සුළු වෙනස්වීම් දැක්විය. 1963 දී රුපියල් කෝටි 0.9 ක හිගයක් දැක්වූ 'ප්‍රජාව' සමග පැවති වෙළෙඳම තව දුරටත් පහත වැටුනි. මෙම වසරේ දී එම හිගය රුපියල් කෝටි 6.2 ක් විය. 'යුරෝපීය නිදහස් වෙළෙඳ සංගමයට යැවුනු අපනයන රුපියල් කෝටි 547 ක් වූයේ පසුගිය වසරට වඩා තියුණු ලෙස රුපියල් කෝටි 5.3 කින් හෙවත් සියයට 17 කින් පහත වැටිනි. මෙම රටවල් සමග වෙළෙඳමෙන්, වෙළෙඳ ශේෂයෙහි රුපියල් කෝටි 18.2 ක අතිරික්තයක් ඇති විය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 3.9 ක අඩුවීමෙක් දැක්විය.

ආසියාතික සහ, ඈත පෙරදිග ආර්ථික සමාජය' ට (මෙම ප්‍රදේශයට දැනට ඕස්ට්‍රේලියාව, නවසීලන්තය හා බටහිර සැමෝවා දූපත් ද ඇතුළත් වෙයි.) යැවුනු අපනයන රුපියල් කෝටි 42.8 ක් විය. මෙම ප්‍රදේශයෙන් ආනයනය කළ භාණ්ඩ

රුපියල් කෝටි 96·7 ක් වටනේ විය. ලංකාවේ මුළු අපනයනයන්ගෙන් සියයට 23 ක්ද මුළු ආනයනයන්ගෙන් සියයට 49 ක්ද මෙම ප්‍රදේශයට අයත් විය. මෙම ප්‍රදේශය සමග වෙළෙඳමෙන් වෙළෙඳ ශේෂයෙහි රුපියල් කෝටි 53·9 ක හිඟයක් ඇති විය.

**චීනය සමග වෙළෙඳම.**

II අා - 7 සංඛ්‍යා සටහනින් චීන ලංකා වෙළෙඳ ගනුදෙනු පිළිබඳ විස්තර දැක්වෙයි.

සංඛ්‍යා සටහන II (අා) 7

**චීනය සමග වෙළෙඳම.**

| වර්ෂය | අපනයන | | ආනයන * | | වෙළෙඳ ශේෂය |
|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශ ලක්ෂ | මුළු ප්‍රාදේශීය අපනයන වලින් සියයට ගණන | වටිනාකම රු. දශ ලක්ෂ | මුළු ආනයන වලින් සියයට ගණන | රු. දශ ලක්ෂ |
| 1956 .. .. | 182 | 11·0 | 134 | 8·2 | + 48 |
| 1957 .. .. | 167 | 10·5 | 84 | 4·6 | + 83 |
| 1958 .. .. | 78 | 4·7 | 152 | 8·8 | — 74 |
| 1959 .. .. | 78 | 4·6 | 150 | 7·5 | — 72 |
| 1960 .. .. | 121 | 6·6 | 132 | 6·8 | — 12 |
| 1961 .. .. | 83 | 4·9 | 35 | 2·0 | + 48 |
| 1962 .. .. | 133 | 7·5 | 41 | 2·5 | + 92 |
| 1963 .. .. | 101 | 5·9 | 138 | 9·2 | — 37 |
| 1964 .. .. | 122 | 6·6 | 204 | 10·3 | — 82 |

සංඛ්‍යා. ලංකා රේගු වාර්තා වලිනි.

* චීන වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම යටතේ සැපයුනු බුරුම සහල් හැර.

1964 දී ලංකා චීන වෙළෙඳමෙහි පිරිවැටුම සැළකිය යුතු අන්දමින් වැඩිවිය. වසර තුළ අපනයන රුපියල් කෝටි 2·1 කින් හෙවත් සියයට 21 කින් ,ද ආනයන ඊට වැඩි වේගයකින් රුපියල් කෝටි 6·6 කින් හෙවත් සියයට 48 කින් ද වැඩිවිය. 1963 දී රුපියල් කෝටි 3·7 ක් වූ වෙළෙඳ ශේෂයේ හිඟය මෙම වසරේ දී රුපියල් කෝටි 8·2 දක්වා වැඩි විය.

චීනයට අපනයන කළ ප්‍රධාන භාණ්ඩය වූ රබර් වල වටිනාකම මෙම වසරේ දී රුපියල් කෝටි 9·35 ක් විය. මෙය 1963 දී ට වඩා රුපියල් කෝටි 0·79 ක හෙවත් සියයට 9 ක වැඩිවීමෙක් විය. අපනයන වූ රබර් පරිමාව රාත්තල් කෝටි 7·29 ක් (මෙට්‍රික් ටොන් 33,055) විය. පොල්තෙල් අපනයන රුපියල් කෝටි 2·08 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 0·58 ක හෙවත් සියයට 39 ක වැඩිවීමෙක් විය. මෙම වසරේ දී පළමුවරට තේ අපනයනය කෙරුනු අතර, රාත්තල් කෝටි 0·36 ක් වූ එම තේ රුපියල් කෝටි 0·75 ක් වටනේ විය. රුපියල් කෝටි 13·04 ක්වූ සහල් ආනයන ප්‍රධාන ආනයන භාණ්ඩය විය. මෙම ආනයන පසුගිය වසරට වඩා රුපියල් කෝටි 5·32 ක හෙවත් සියයට 96 කින් වැඩිවීමෙක් දැක්විය. පසුගිය වසර කිහිපයේ දී ප්‍රධාන ආනයන භාණ්ඩයක්ව පැවැති රෙදිපිළි ආනයන මෙම වසරේදී රුපියල් කෝටි 4·35 ක් වටනේවිය. මෙවා පසුගිය වසරට වඩා රුපියල් කෝටි 2·47 ක හෙවත් සියයට 131 ක වැඩිවීමෙක් දැක්විය සීනි ආනයන රුපියල් කෝටි 0·95 (සියයට 101) කින් වැඩි වූයේ මෙම වසරේදී රුපියල් කෝටි 1·89ක වටිනාකමෙක් දැක්විය.

චීනය සමග පවතින වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම අනුව වසර තුළදී මෙට්‍රික් ටොන් 35,000 කට ෂීට් රබර් එම රටට අපනයනය කිරීමටත්, සහල්, මෙට්‍රික් ටොන් 2,00,000 ක් ආනයනය කිරීමටත් 1964 දී ගිවිසගන්නා ලදී.

**එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව හා නැගෙනහිර යුරෝපය සමග වෙළෙදාම.**

II ආ - 8 සංඛ්‍යා සටහන මෙම ප්‍රදේශය සමග ලංකාව කළ වෙළෙඳම පිළිබඳ සංඛ්‍යා තොරතුරු දක්වයි.

සංඛ්‍යා සටහන. II (ආ) 8

**එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව සහ නැගෙනහිර යුරෝපය* සමග වෙළෙදාම**

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය | වෙළෙඳ පිරිවැටුම | |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම රු. දශලක්ෂ | මුළු දේශිය අපනයන යෙන් සිය යට ගණන | වටිනාකම රු. දශලක්ෂ | මුළු ආනයන යෙන් සිය යට ගණන | රු. දශලක්ෂ | වටිනාකම රු. දශලක්ෂ | මුළු වෙළෙඳ පිරිවැටුමෙහි සියයට ගණන |
| 1956 .. | 1·3 | 0·1 | 8·0 | 0·5 | — 6·7 | 9·3 | 0·3 |
| 1957 .. | 6·5 | 0·4 | 10·6 | 0·6 | — 4·1 | 17·1 | 0·5 |
| 1958 .. | 24·7 | 1·5 | 9·2 | 0·5 | +15·5 | 33·9 | 1·0 |
| 1959 .. | 28·4 | 1·7 | 23·8 | 1·2 | + 4·6 | 52·2 | 1·4 |
| 1960 .. | 58·1 | 3·3 | 21·8 | 1·1 | +36·3 | 79·9 | 2·1 |
| 1961 .. | 78·4 | 4·7 | 51·8 | 3·0 | +26·6 | 130·2 | 3·9 |
| 1962 .. | 87·1 | 4·9 | 90·3 | 5·4 | — 3·2 | 177·4 | 5·2 |
| 1963 .. | 86·1 | 5·1 | 117·1 | 7·8 | —31·0 | 203·2 | 6·3 |
| 1964 .. | 159·4 | 8·7 | 158·2 | 8·0 | + 1·2 | 317·6 | 8·3 |

සංඛ්‍යා – ලංකා රේගු වාර්තාවලිනි.

* බල්ගේරියාව, චෙකෝස්ලෝවැකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව (නැගෙනහිර ජර්මනිය) හන්ගේරියාව, පෝලන්තය, රුමේනියාව සහ යුගෝස්ලේවියාව.

1964 දී මෙම ප්‍රදේශයට යැවුනු අපනයනයන් පෙර වසරට වඩා රුපියල් කෝටි කෝටි 7·33 කින් හෙවත් සියයට 85 කින් තියුණු ලෙස වැඩි විය. ආනයනයන්ගේ වැඩිවීමෙහි එතරම් තියුණු බවක් නොවූයේ රුපියල් කෝටි 4·11 කින් හෙවත් සියයට 35 කින් වැඩි විය. මෙම ප්‍රදේශය සමග ලංකාවේ වෙළෙඳ ශේෂය 1962 හා 1963 දී පිළිවෙළින් රුපියල් කෝටි 0·32 ක හා රුපියල් කෝටි 3·10 බැගින් හිඟයයන් දක් වූයේ මෙම වසරේ දී ඉතා හිතකර අන්දමේ දියුණුවක් ලබමින් රුපියල් කෝටි 0·12 ක අතිරික්තයෙක් දක් විය.

1964 දී ද එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව මෙම පෙදෙසෙහි ලංකාවේ ප්‍රධානතම අනුග්‍රාහකයා විය. එම පෙදෙසට යැවුනු ලංකා අපනයන වලින් රුපියල් කෝටි 10·10 ක් හෙවත් සියයට 63 ක්වූ ප්‍රමාණයක් එම රටට යැවුනෝ විය. මෙම වසරේ දී එම රටට යැවුනු අපනයනයන් රුපියල් කෝටි 6·81 කින් හෙවත් සියයට 207 කින් වැඩි විය. මුළු පෙදෙසට ම යැවුනු අපනයන-යන්ගේ ද වටිනාකම වැඩිවීමට මෙම කරුණු හේතු විය. සෝවියට් සමූහාණ්ඩුවට යැවුනු අපනයනවල ප්‍රසාරණයට වැඩි පමණෙකින් හේතු වූයේ රබර් අපනයන රුපියල් කෝටි 4·91 කින් වැඩිවීමයි. (පසුගිය වසරේ දී රබර් අපනයනවල වටිනාකම රුපියල් ·05 ක් පමණක් විය.) මෙය වසරේ දී අපනයනය වුනු ප්‍රධාන භාණ්ඩ විය. රුපියල් කෝටි 3·32 ක් වූ තේ අපනයන රුපියල් කෝටි 1.41 කින් (හෙවත් සියයට 74 කින්) ද, රුපියල් කෝටි 1·71 ක් වූ පොල්තෙල් අපනයන රුපියල් කෝටි 0·61 කින් (හෙවත් සියයට 55 කින්) ද වැඩි විය. මෙම පෙදෙසට

යැවුනු මුළු අපනයනයන්ගෙන් රුපියල් කෝටි 3·13 ක් හෙවත් සියයට 20 ක් යැවුනේ පෝලන්තයටය. මෙය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 0·98 ක හෙවත් සියයට 46 ක වැඩිවීමෙක් දක්විය. පෙර වසරේදී මෙන්ම මෙම වසරේ දී ද ප්‍රධාන අපනයන භාණ්ඩය රබර් විය. රුපියල් කෝටි 2·57 ක් වූ මෙම අපනයනය පසුගිය වසරට වඩා රුපියල් කෝටි 0·65 කින් හෙවත් සියයට 34 කින් වැඩිවීමෙක් දක්විය. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවට යැවුනු අපනයනයන් තියුණු ලෙස රුපියල් කෝටි 1·02 (සියයට 537) කින් වැඩි වූයේ මුළු අපනයන වටිනාකම රුපියල් කෝටි 1·21 ක් විය. මෙය එම ප්‍රදේශයට යැවුනු මුළු අපනයනයන්ගෙන් සියයට 8 ක් විය. පොල්තෙල් අපනයන රුපියල් කෝටි 0·86 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 0·74 ක වැඩිවීමෙක් දැක්විය. රුමේනියාවට යැවුනු අපනයන 1958 දී රුපියල් කෝටි 2·33 ක් වූයේ, මෙම වසරේ දී ඉතා තියුණු ලෙස රුපියල් කෝටි 0·17 දක්වා පහත වැටිණි.

සෝවියට් සමූහාණ්ඩුව, පෝලන්තය හා චෙකෝස්ලොවේකියාව වසර තුළ දී මෙම පෙදෙසෙහි වූ ප්‍රධාන ආනයන සැපැයුම් කරුවෝ වූහ. මෙම ආනයනයන්ගේ වටිනාකම පෙදෙසෙන් සැපැයුන ආනයනයන්ගෙන් පිළිවෙළින් රුපියල් කෝටි 6·88 (සියයට 43) රුපියල් කෝටි 4·55 (සියයට 29) හා රුපියල් කෝටි 2·06 (සියයට 13) බැගින් වටනේ විය. ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුවෙන් සැපැයුනු ආනයනයන් රුපියල් කෝටි 0·92 ක් වටනේ විය. පෙර වසරේ දී මෙන්ම සෝවියට් සමූහාණ්ඩුවෙන් සැපැයුනු ආනයන අතර, පළමු තැන ගත්තේ පෙට්‍රෝලියම් නිෂ්පාදිතයන්ය. මෙම නිෂ්පාදිතයන්ගේ ආනයන වටිනාකම රුපියල් කෝටි 4·22 ක් වූයේ පසුගිය වසරට වඩා රුපියල් කෝටි 1·52 (සියයට 56) ක වැඩිවීමක් දැක්විය. මෙම ආනයනයන් එම රටින් සැපයුනු මුළු ආනයනයන්ගෙන් සියයට 61 ක්වූයේ, මෙම නිෂ්පාදිතයන්ගේ මුළු ආනයන වටිනාකමෙන් සියයට 45ක් විය. රුපියල් කෝටි 0·76 ක් වූ තේ පෙට්ටි ආනයන පෙර වසරට වඩා රුපියල් කෝටි 0·39 (සියයට 105) ක වැඩිවීමෙක් දැක්විය. මෙය මුළු තේ පෙට්ටි ආනයන වටිනාකමින් සියයට 51 ක් විය. පෝලන්තය, චෙකෝස්ලෝවේකියාව හ ජර්මන් ප්‍රජාතන්ත්‍රවාද සමූහාණ්ඩුව ප්‍රධාන වශයෙන් සැපයූ ආනයනය වූයේ සීනිය. මෙම රට වලින් සැපයුනු මුළු ආනයනයන්ගෙන් පිළිවෙළින් රුපියල් කෝටි 3·14 (සියයට 69) රුපියල් කෝටි 1·18 (සියයට 57) සහ රුපියල් කෝටි 0·33 (සියයට 36) ක් සීනි ආනයනයන් විය.

**ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම්**

චීනය, සෝවියට් සමූහාණ්ඩුව සහ නැගෙනහිර යුරෝපයේ හා මැද පෙරදිග තවත් සමහර රටවල් සමග ලංකාව ඇති කරගත් ගෙවීම් ගිවිසුම් අනුව පවත්වා ගනු ලබන ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම් වල ඒ ඒ කාර්තු අවසානයේ දී වූ ශුඩ සමුච්චය තත්වය II ආ - 9 සංඛ්‍යා සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II (ආ), 9

## ද්විපාර්ශ්වීය නිෂ්කාශන ගිණුම් - 1959 - 1964 නිෂ්කාශන ගිණුම්වල (ශුද්ධ) එකතුව - කාර්තු වශයෙන්

රුපියල් දශලක්ෂ වලින්

| අවසානයට ගිණුම් තතු (ශුද්ධ) | චීනය, එ.ස.සෝ.සං. සහ අනෙකුත් නැගෙනහිර යුරෝපීය රටවල්* | | මැද පෙරදිග රටවල් ** | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | බැර | හර | බැර | හර |
| 1959 මාර්තු | 10·3 | — | — | — | 10·3 | — |
| ජූනි | — | 4·5 | — | — | — | 4·5 |
| සැප්තැම්බර් | 22·2 | — | — | — | 22·2 | — |
| දෙසැම්බර් | — | 11·7 | — | — | — | 11·7 |
| 1960 මාර්තු | — | 18·9 | — | — | — | 18·9 |
| ජූනි | — | 2·6 | — | — | — | 2·6 |
| සැප්තැම්බර් | — | 13·3 | — | — | — | 13·3 |
| දෙසැම්බර් | — | 26·5 | — | — | — | 26·5 |
| 1961 මාර්තු | — | 39·4 | — | — | — | 39·4 |
| ජූනි | — | 25·5 | — | 1·7 | — | 27·2 |
| සැප්තැම්බර් | 11·8 | — | — | 1·9 | 9·9 | — |
| දෙසැම්බර් | 10·6 | — | — | 5·4 | 5·2 | — |
| 1962 මාර්තු | — | 6·9 | — | 7·0 | — | 13·9 |
| ජූනි | — | 42·8 | — | 10·7 | — | 53·5 |
| සැප්තැම්බර් | — | 22·3 | — | 10·8 | — | 33·1 |
| දෙසැම්බර් | — | 7·3 | — | 5·4 | — | 12·7 |
| 1963 මාර්තු | — | 0·2 | — | 2·7 | — | 2·9 |
| ජූනි | 12·2 | — | 0·6 | — | 12·8 | — |
| සැප්තැම්බර් | — | 6·5 | 2·1 | — | — | 4·4 |
| දෙසැම්බර් | 31·1 | — | 3·1 | — | 34·2 | — |
| 1964 මාර්තු | 52·3 | — | — | 0·3 | 52·0 | — |
| ජූනි | 58·4 | — | 2·4 | — | 60·8 | — |
| සැප්තැම්බර් | 59·1 | — | — | 1·9 | 57·2 | — |
| දෙසැම්බර් | 57·0 | — | — | 5·5 | 51·5 | — |

සංඛ්‍යා — ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* බල්ගේරියාව, චෙකොස්ලොවේකියාව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව (නැගෙනහිර ජර්මනිය), හංගේරියාව, පෝලන්තය සහ රුමේනියාව.

** එක්සත් අරාබි සමූහාණ්ඩුව අයිරානය සහ සිරියාව,

සැ. යු. බැර — ලංකාවෙන් අයවිය යුතු,
හර — ලංකාවට අයවිය යුතු

### වාණිජ ප්‍රතිපත්ති සැකසුනු අයුරු

### ආනයන පාලනය

1963 දී බොහෝ දුරට දැඩි කරන ලද ආනයන පාලන විධිවිධානයන් 1964 දී තවදුරටත් දැඩි කරන ලදී. 1964 දෙසැම්බර් 15 දින, ඖෂධ වගී පුද්ගලික ආනයන බලපත්‍ර විධිවිධානයන්ට යටත් කිරීමත් සමගම විවෘත ආනයන බලපත්‍ර විධි විධාන ක්‍රමය මුළුමනින්ම අහෝසි විය. මෙයින් පැහැදිලි වන්නේ වැදගත් බැවින් ඉතා අඩු භාණ්ඩ කීපයක් හැරෙන්නට පුද්ගලික අංශයේ අනෙකුත් සියළු ආනයන පුද්ගලික ආනයන බලපත්‍ර විධි විධානයන්ට යටත් වූ බවය. වසර තුලදී පණවන ලද වඩා වැදගත් ආනයන විධි විධානයන් ද ඒ වායේ ප්‍රමාණාත්මක බලපෑම් පිළිබඳ ඇස්තමේන්තුවක් ද II ආ - 10 සංඛ්‍යා සටහනින් දැක්වෙයි.

1963 ආනයන අනුව මනින කල ප්‍රධාන පාලන විධි විධානයන්ට යටත් වූ ආනයනයන් ගේ වටිනාකම රුපියල් කෝටි 22.3 ක් හෙවත් එම වර්ෂයේ ආනයනයන් ගෙන් සියයට 15 ක් විය. මෙම ආනයනයන් ගේ වටිනාකම 1964 දී රුපියල් කෝටි 4·2 කින් රුපියල් කෝටි 26·5 දක්වා වැඩිවිය. එනමුදු මුළු ආනයන වටිනාකමින් එයට අයත් වූයේ සියයට 13 ක් පමණක් වූ කොටසකි. වසර අගදී බල පැවැත්වුනු පාලන විධි විධානයන්ට යටත්වූ ආනයනයන්ගේ වටිනාකම 1963 ආනයනයන් අනුව බැලූ කල, රුපියල් කෝටි 107·2 ක් හෙවත් එම වසරේ මුළු ආනයනයන් ගෙන් සියයට 72 ක් විය. 1964 දී මෙම ආනයනයන්ගේ වටිනාකම රුපියල් කෝටි 13·7 කින් රුපියල් කෝටි 120·9 දක්වා වැඩි විය. එනමුදු මුළු ආනයනයන් අතර එහි කොටස සියයට 61 දක්වා පහත වැටුනි.

1964 විදේශ විනිමය අයවැය ලේඛනයේ සඳහන් ආනයන ප්‍රමාණ වෙන් කිරීම් වල ප්‍රතිශෝධනයන් ඇති කෙරෙන බව මුදල් ඇමති තුමා 1964 ජූලි 30 වැනි දින, එතුමා ගේ අයවැය ලේඛන කථාවෙන් ප්‍රකාශයට පත් කෙළේය. මෙම ප්‍රතිශෝධනය අනුව වසර සඳහා වෙන්වුනු ආනයන වටිනාකම රුපියල් කෝටි 184·6 ක් විය. මෙයින් රුපියල් කෝටි 102·0 ක් (රුපියල්කෝටි 77·5ක් වූ රජය විසින් කෙලින්ම ආනයනය කරන ලද ආහාර හා ආහාර සඳහා නොවූ භාණ්ඩද විවෘත ආනයන බලපත්‍ර යටතේ ආනයනය කළ රුපියල් කෝටි 24·5 ක් වටිනා භාණ්ඩවලින් සමන්විතවූ) පාලන විධිවිධානයන්ට යටත් නොවූ අතර ඉතිරි රුපියල් කෝටි 82·6 පුද්ගලික ආනයන පාලන විධිවිධානයන්ට යටත් වූයේය. ආනයන ප්‍රමාණයන්ගේ මෙම වෙන් කිරීම වසරෙහි අවසාන භාගයේදී තවදුරටත් ප්‍රතිශෝධනය කරන ලදී.

කිරුබදු

වසර තුලදී අපනයන බදු වල පහත සඳහන් අන්දමේ වෙනස්වීම් ඇතිවීය.

අපනයන බදු

**1964 මැයි 12 දින** – පොල් පුන්නක්කු සඳහා ටොන් එකකට රුපියල් 50 ක්ව පැවති බද්ද නැවත ටොන් එකකට රුපියල් 25 දක්වා අඩු කරන ලදී.

**1964 අගෝස්තු 1 දින**– කොළඹ තේ වෙන්දේසියේ දී විකුණා කොළඹ ගබඩා කොට පසුව ගාල්ල හෝ ත්‍රිකුණාමලය වරාය වලින් අපනයනය කරන ලද තේ සඳහා රාත්තලකට ශත 33 ක්ව පැවති සහනදායක බද්ද ඉවත් කරන ලදී. ඉන් පසු සියළු තේ සඳහා රාත්තලකට සත 35 ක් වූ සාමාන්‍ය බද්ද බල පැවැත්වුනි.

**1964 අගෝස්තු 1 දින**– සියළුම වර්ගයන්හි මැණික් ගල් සඳහා සියයට 5 ක වටිනාකම් අනුව බද්දක් පනවන ලදී.

**1964 අගෝස්තු 9 දින**– 1964 ජනවාරි 7 වැනි දින පනවන ලද බද්ද වෙනුවට නව අනුක්‍රම පරිමාණ බද්දක් සියළු පොල් නිෂ්පාදිත සඳහා පැනවුනි. ඉහත සඳහන් අනුක්‍රම පරිමාණය නියම කරන ලද්දේ ප්‍රධාන රේගු අයකැමි විසින් ඇස්තමේන්තු කොට සතිපතා දන්වනු ලබන සිංගප්පූරු පොල්තෙල් සඳහා ලන්ඩනයේ පැවති සාමාන්‍ය මි. ර. ගැ. මිල අනුවය. නව

සංඛ්‍යා සටහන II (ආ) 10

## ආනයන පාලනය

### පෞද්ගලික ආනයන බලපත්‍ර ක්‍රමය බලපා ඇති ප්‍රමාණය – 1964

| | ආනයන වටිනාකම | | | | | | | | වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1961 | | 1962 | | 1963 | | 1964 | | 1961 ට වඩා 1962 | | 1962 ට වඩා 1963 | | 1963 ට වඩා 1964 | |
| | රු. දශ ලක්ෂ | මුළු ආනයනයෙහි %වගණන | රු. දශ ලක්ෂ | මුළු ආනයනයෙහි %වගණන | රු. දශ ලක්ෂ | මුළු ආනයනයෙහි %වගණන | රු. දශ ලක්ෂ | මුළු ආනයනයෙහි %වගණන | මුළු ප්‍රමාණය රු. දශලක්ෂ | % | මුළු ප්‍රමාණය රු. දශලක්ෂ | % | මුළු ප්‍රමාණය රු. දශලක්ෂ | % |
| **1964 ආරම්භයේදී පැවති සීමා කිරීම්වල මුළු ආසන්න බලපෑම්** .. | 1,014 | 59.5 | 1,021 | 61.5 | 849 | 57.0 | 944 | 47.8 | +7 | +0.7 | —172 | —16.8 | +95 | +11.2 |
| **1964 අගෝස්තු 13.** අංක 15/64 දරණ ආනයන පාලන නිවේදනය- කැකුළු වර්ග, මී පැණි, මැකරෝනි, ස්පැගටි හා වර්මිසෙලි, ආහරයට ගන්නා පලතුරු ගෙඩි වර්ග, වියලි පලතුරු, වියලි එළවළු, තල්සූකිරි ඇතුළු විවිධ ආහාර වර්ග සහ සත්ව ආහාර .. | 2 | 0.1 | 2 | 0.1 | 5 | 0.3 | 4 | 0.2 | — | — | +3 | +150.0 | — 1 | —20.0 |
| **1964 අගෝස්තු 25** අංක 16/64 සහ 17/64 දරණ ආනයන පාලන නිවේදනය–කිරි හා කිරි නිෂ්පාදිත, (ළදරු හා පෝෂාදායී ආහාර ඇතුළු), බටර් සහ අනෙකුත් කිරි නිෂ්පාදිත. .. .. | 65 | 3.8 | 77 | 4.6 | 78 | 5.2 | 94 | 4.8 | +12 | +18.5 | +1 | +1.3 | +16 | +20.5 |
| **1964 නොවැම්බර් 10** අංක 21/64 දරණ ආනයන පාලන නිවේදනය– වියලි මිරිස් සහ අර්තාපල් .. .. | 53 | 3.1 | 59 | 3.6 | 64 | 4.3 | 72 | 3.6 | +6 | +11.3 | +5 | +8.5 | + 8 | +12.5 |
| **1964 නොවැම්බර් 25.** අංක 22/64 දරණ ආනයන පාලන නිවේදනය– බෝංචි, මෑ සහ මෑ වර්ගයේ අනෙකුත් ඇට, කුළු බඩු, මෝල්ට්, බීරමල් සහ සුදුළුනු ඇතුලු අංක 1 දරණ බලපත්‍ර ලේඛනයේ 1 සිට 42 දක්වාවූ ශීර්ෂයන් .. .. .. | 60 | 3.5 | 60 | 3.6 | 53 | 3.6 | 68 | 3.4 | — | — | —7 | —11.7 | +15 | +28.3 |
| **1964 දෙසැම්බර් 15** අංක 25/64 දරණ ආනයන පාලන නිවේදනය– ඖෂධ වර්ග, .. .. .. | 28 | 1.6 | 26 | 1.6 | 23 | 1.5 | 27 | 1.4 | —2 | —7.1 | —3 | —11.5 | + 4 | +17.4 |
| **1964 අවසානයේ පැවති සීමාකිරීම්වල ආසන්න බලපෑම්** .. .. | 1,222 | 71.7 | 1,245 | 75.0 | 1,072 | 71.9 | 1,209 | 61.2 | +23 | +1.9 | —173 | —13.9 | +137 | +12.8 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තා සහ ආනයන පාලන නිවේදන

සැ. යු. මෙහි බලපෑම් නියත වශයෙන්ම ආසන්න ප්‍රමාණයකින් වෙයි. එයට හේතුව සීමා කිරීම සඳහා තෝරාගනු ලබන ඇතැම් ආනයන ශීර්ෂ (බොහෝ විටම ප්‍රමාණයෙන් ඉතා කුඩා වූ හෝ වෙන් වෙන්ව වර්ග කැරුන) රේගු වාර්තාවන් මගින් වෙන් වශයෙන් හඳුනා ගැනීමට නොහැකි වීමය.

අනුක්‍රම පරිමාණය ද මෙවැනිම මිල ඇස්තමේන්තුවක් මත ගොඩනැගුණ ද ඒ සඳහා උපයෝගී කරගන්නා ලද්දේ පිලිපින කොප්පරා සඳහා ලන්ඩනයේ වූ සාමාන්‍ය මි. ර. ගැ. මිලය.

මෙම අනුක්‍රම පරිමාණය අනුව අවම බදු පහත සඳහන් වේ.

| රේගු අයකැමි විසින් ඇස්තමේන්තු කොට දක්වන ලද ලන්ඩනයේ පිලිපින කොප්පරා සඳහා පැවති සාමාන්‍ය මි. ර. ගැ. මිල | කොප්පරා ටොන් එකක් සඳහා බද්ද රු. සත | පොල්තෙල් ටොන් එකක් සඳහා බද්ද රු. සත | කපාපු පොල් ටොන් එකක් සඳහා බද්ද රු. සත | ගෙඩි පොල් දහසක් සඳහා බද්ද රු. සත |
|---|---|---|---|---|
| එ. ජ. ඩොලර් 124 ට අඩු වූ විට .. | 115·00 | නැත | නැත | 28·75 |
| එ. ජ. ඩොලර් 124 ක් වූ විට .. | 115·00 | නැත | නැත | 28·75 |
| එ. ජ. ඩොලර් 124 වැඩි එනමුදු ඩොලර් 126 ට අඩු විට .. | 117·93 | 4·76 | 4·04 | 29·48 |

එ. ජ. ඩොලර් 278 කට ඇස්තමේන්තු කරන ලද මි. ර. ගැ. මිලක් ඇතිවිට ගෙවිය යුතු උපරිම බදු පිළිවෙලින් රුපියල් 469·58, රුපියල් 576·19, රුපියල් 489·82 හා රුපියල් 117·39 බැගින් වෙයි.

**ආනයන බදු.**

1964 / 65 අයවැය යෝජනාවන්ට අනුකූලව 1964 අගෝස්තු 1 වන දින සිට පෙට්‍රෝලියම් නිෂ්පාදිත සඳහා ආනයන බදු පහත සඳහන් අයුරින් වැඩි කරන ලදී.

| නිෂ්පාදිතය | ගැලුමක් සඳහා වැඩියෙන් අයකරන බද්ද |
|---|---|
| පැට්‍රෝල්, සුපිරි | සත 12 |
| පැට්‍රෝල්, සාමාන්‍ය | සත 10 |
| භූමිතෙල් | සත 10 |
| මෝටර් ඩීසල් තෙල් | සත 7 |
| බර ඩීසල් තෙල් | සත 7 |
| කර්මාන්ත උදුන් තෙල් | සත 1 |
| ලිහිස්සි තෙල් | සත 20 |

මෙම යෝජනා ඉදිරිපත් කරමින් මුදල් ඇමතිවරයා මෙසේ කියා සිටියේය.

" මේ ආනයන තීරුබදු වැඩි කිරීම සම්පූර්ණයෙන්ම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ආදායමෙන් පිලව්වන අතර, ඒවා පාරිභෝගිකයන් කෙරෙහි නොපැවරේ. මේ තීරු බදු වැඩි කිරීමෙන් අදහස් කර ඇත්තේ දැනට ලංකා ඛනිජ තෙල් සංස්ථාවට තෙල් සපයන්නන්ගෙන් ලැබෙන වට්ටම් රජයේ ආදායමට හරවා ගැනීමයි. ලංකාණ්ඩුවට දී ඇති මෙම වට්ටම් ඛනිජ තෙල් සංස්ථාවටම තවදුරටත් ලාභ වශයෙන් තබා ගන්නට ඉඩ හැරියොත් එම සංස්ථාවේ නියම මූල්‍ය තත්ත්වය පිළිබඳ අසත්‍ය වාර්තාවක් පෙන්නුම් කෙරෙනවා ඇත. මේ යෝජනාවේ ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ආදායම රුපියල් කෝටි 1·5 කින් වැඩි වනු ඇත." (1)

**වෙළෙඳ ගිවිසුම්.**

වසර තුලදී පහත සඳහන් රටවල් සමග වෙළෙඳ හෝ ගෙවීම් ගිවිසුම් ඇතිකර ගන්නා ලදී.

(1) 1964/65 අයවැය ලේඛන දේශනය — 57 පිට

**ඉන්දියාව.**

1961 ඔක්තෝබර් 28 වැනි දින දරන ඉන්දු - ලංකා වෙළෙඳ ගිවිසුම අනුව 1964 ටද වෙළෙඳ විධිවිධාන පිළියෙල කිරීම සඳහා ජනවාරියේදී සාකච්ඡා පවත්වන ලදී. මේ අනුව කොප්පරා ටොන් 15,000 ක් ද, පොල් තෙල් ටොන් 5,000 ක්ද රබර් ටොන් 3,000 ක්ද, ලංකාවෙන් අපනයනය කිරීමට විධිවිධාන යොදවන ලදී. එම වැඩ පිළිවෙළ අනුව අඩු වශයෙන් කරවල ටොන් 21,000 ක් ද, සියඹලා ටොන් 1,500 ක් ද, සක්කර හොන්ඩර 40,000 ක් ද අතින් වියන ලද රෙදිපිළි රුපියල් 300,000 ක වටිනාකමක් දක්වා ද මිලදී ගත යුතු විය.

**යුගෝස්ලාවියාව.**

පවුම් දශ ලක්ෂයක් වටිනාකමකින් යුතු ද්විපාර්ශ්වීය භාණ්ඩ හුවමාරුවක් සඳහා 1964 පෙබරවාරි 14 වැනි දින ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම ගිවිසුම වර්ෂයක් සඳහා වලංගු වූ අතර එය තවදුරටත් දීර්ඝ කිරීම දෙරටෙහි කැමැත්ත අනුව කළහැකි විය. මෙම ගිවිසුමෙහි සඳහන් පරිදි දෙරට අතර වෙළෙඳම ස්වයං තුලිත ක්‍රමයකින් පැවතිය යුතු වූ අතර එම වෙළෙඳම 1953 ජූලි 30 වැනි දින දරන වෙළෙඳ සම්මුතියේ සඳහන් වූ වෙළෙඳමට අතිරේක කටයුත්තක් විය.

**එක්සත් සමාජවාදී සෝවියට් සංගමය.**

1965 – 67 අතර ද්විපාර්ශ්වීය භාණ්ඩ හුවමාරුව සඳහා 1965 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන ගිවිසුමක් 1964 ඔක්තෝබර් 1 දින සම්මත කරන ලදී. මෙම භාණ්ඩ හුවමාරුව 1958 පෙබරවාරි 8 වැනි දින වෙළෙඳ හා ගෙවීම් ගිවිසුමෙහි විධිවිධානයන්ට අනුව සිදුවිය යුතු විය. මෙම ගිවිසුමත් සමග කරන ලද අධිකාරි පත්‍ර හුවමාරුවක් මගින් 1958 පෙබරවාරි 8 වැනි දින ගෙවීම් ගිවිසුමෙහි සඳහන් රන් පවුම් 3,00,000 භ්‍රමණ ණය රන් පවුම් 5,00,000 දක්වා වැඩි කිරීමට ද මෙම සීමාවට අතිරේක වූ ශේෂයන් පියවීමේ කාල සීමාව එක් මසෙහි සිට තෙමස දක්වා දීර්ඝ කිරීමට ද එකඟවිය.

**මහජන චීන සමූහාණ්ඩුව.**

1962 ඔක්තෝබර් මස 3 වැනි දින මහජන චීන සමූහාණ්ඩුව සමග ඇති කරගත් ගිවිසුම අනුව 1965 වර්ෂය සඳහා භාණ්ඩ හුවමාරු කර ගැනීම පිණිස එකගත්වයක් 1964 ඔක්තෝබර් මස 24 වැනි දින ඇතිකර ගන්නා ලදී. මෙම එකගත්වය අනුව රුපියල් කෝටි 11·2 දක්වා වෙළෙඳම ද්විපාර්ශ්විකව පුළුල් කර ගැනීමට පහසුකම් සැලසුනි. රුපියල් කෝටි 9·5 ක් වටිනා රබර් මෙට්‍රික් ටොන් 38,000 ක් මිලදී ගැනීමට චීනය එකඟ වූ අතර, ලංකාව එම ප්‍රමාණයටම වටිනාකමින් යුත් සහල් ටොන් 2,00,000 ක් මිලදී ගැනීමට එකඟ විය.

**ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහාණ්ඩුව. (නැගෙනහිර ජර්මනිය)**

1964 දෙසැම්බර් 14 වැනි දින කරන ලද අධිකාරි පත්‍ර හුවමාරුවක් මගින් ඊට පෙර 1961 අප්‍රියෙල් 22 වැනි දින ඇති කරන ලද විධිවිධානයන් ඉවත් කරන ලදී. මෙම අලුත් විධිවිධාන පළමුව වසරකට පමණක් වලංගු වන අතර, ඉන්පසු වසරක් පාසා ස්වයංක්‍රිය ලෙස දීර්ඝ කළ හැකිය. මේ අනුව රටවල් දෙක අතර හුවමාරු කළ යුතු භාණ්ඩ පිළිබඳ අළුත් ලේඛනයක් ඉදිරිපත් කරන ලද අතර, එයට ලංකාවේ නව කාර්මික නිෂ්පාදිතයන්ගේ අපනයනයද ඇතුලත් විය. මෙම විධි විධානයන් ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින දුෂ්කරතාවන් පිළිබඳව සලකා බැලීමට රටවල් දෙකෙහි නියෝජිතයන් අඩංගු මිශ්‍ර කමිටුවක් පත් කිරීමට ද මෙම අධිකාරි පත්‍ර හුවමාරුවෙහි කරුණු සඳහන් කොට තිබුනි. ප්‍රධාන අධිකාරි පත්‍රයන්ට අතිරේකව 1965 වසර තුළ රටවල් දෙක අතර වෙළෙඳාම දියුණු කරන අයුරු විශේෂ වශයෙන් සඳහන් වූ අධිකාරි පත්‍රයන් ද හුවමාරු කර ගන්නා ලදී.